# රණවිරුවා

2019 ඔක්තෝම්බර් / 210 කලාපය



## විරු හිත් නිවන

## ලෙංගතුකම පිරි නායකත්වය...

හමුදාවක භටපිරිස්වල චිත්ත ධෛර්ය වර්ධනයට සිය නායකත්වය ඔවුනට දක්වන සමීප බව බෙහෙවින්ම බලපායි. දශක තුනක් පුරා පැවති රුදුරු ත්‍රස්තවාදය නිමාකිරීමේ සටනේදී මුල සිට අගට ඒ ඒ මට්ටම්වලින් පැවති එකී සබඳතාව අවසන් ජයග්‍රහණයේ රහසයි. යුද්ධ හමුදාධිපතිතුමාගේ මේ ලෙංගතුකම් යළි යළිත් අපට පසක් කරනුයේ එදවස සටන් බිම මතකයයි.

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.



# මුලතිව් බිමට යුද්ධ හමුදාධිපති පැමිණේ

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සිය ධුරයේ රාජකාරී භාරගැනීමෙන් අනතුරුව ඉකුත් ඔක්තෝම්බර් මස 19 දින මුලතිව් ආරක්‍ෂක සේනා මූලස්ථානයේ නිල සංචාරයක නිරත විය. එහිදී මුලතිව් ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ඇරයුමෙන් යුද්ධ හමුදාධිපතිතුමා එම කඳවුරු පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ කායවර්ධන මධ්‍යස්ථානය විවෘත කිරීමටද එක්විය. තවද යුද්ධ හමුදාවේ ඉදිරි දැක්ම හා මෙහෙවර පිළිබඳ යුද්ධ හමුදාධිපතිතුමන් විසින් එහි සියලු නිලයින් දැනුවත් කරන්නටද අමතක නොකරන ලදී.















# 36 වසක අභිමන් සැමරුම



රණකාමී විරුවන් සපිරි යුද්ධ හමුදා ගජබා රෙජිමේන්තුවේ 36 වන සංවත්සරය ඉකුත් ඔක්තෝම්බර් මස 14 දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී අභිමානවත්ව සමරන ලද්දේ "පෙරමුණේ සිට හෙළය රකින" (ජාතිය ඉදිරි පෙළින් ආරක්‍ෂා කිරීම) තේමා ගීතය පෙරදැරිවය. සංවත්සරය නිමිත්තෙන් ගජබා රෙජිමේන්තු අධිපති මෙන්ම වත්මන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් රැසක් පැවැත්විණ. එහිදී මාතෘභූමිය වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් හට පුෂ්පෝපහාර පුදකිරීම, ජය ශ්‍රී මහබෝ සමිඳු අභියස පිරිත් පිංකමක් සහ දානමය පිංකමක් පැවැත්වීම, ගජබා රෙජිමේන්තුවේ නිර්මාතෘ සිහිපත් කිරීම, හමුදා සම්ප්‍රදායානුකූලව පැවැත්වූ සම්මාන පෙළපාළිය ඇතුලු කටයුතු රැසක් සංවත්සර සැමරුම් අතරට එක්ව තිබිණ.









# යුද්ධ හමුදාධිපතිගේ උතුරු සංචාරයේ මතක සටහන්

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් සැප්තැම්බර් 20 දින යාපනය අර්ධද්වීපයේ සංචාරයක නිරත විය. එහි විශේෂිත මතක සටහන්වලින් මෙම පිටුව වර්ණවත් වේ.



## ශ්‍රී නාග විහාරය වැඳපුදාගනී

යුද්ධ හමුදාධිපති යාපනය නගරයේ පිහිටි ශ්‍රී නාග විහාරයේ විහාරාධිපති මීගහජන්දුරේ සිරිවිමල හිමිපාණන් බැහැදුටු අවස්ථාවේ එහි නායක හිමිපාණන් විසින් බුද්ධ මන්දිරයේදී ආගමික වතාවත් සිදුකිරීමෙන් අනතුරුව එතුමන්ට ආශීර්වාද එක්කරමින්.

## ආදීනම් ප්‍රධානී හමුවී

යුද්ධ හමුදාධිපතිතුමා යාපනයේ නල්ලෙයි තිරුඥාණසම්පන්තර් ආදීනම් හිදී නල්ලෙයි ආදීනම් ප්‍රධානී ශ්‍රී ලා ශ්‍රී සෝමසුන්දාර ඥාණසම්පන්ද පරමචරියා ස්වාමිගල් හමුවිය. එහිදී යුද්ධ හමුදාධිපතිතුමන් වෙත එතුමන් සිය ආශිර්වාදය පලකළේය.



## අමරණීය විරුවන් සිහිකර





ත්‍රස්තවාදී ප්‍රහාරයට ලක්ව දැයෙන් සමුගත් නූතන ඉතිහාසයේ අසහාය විරුවන් වූ ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව හා මේජර් ජෙනරාල් විජය විමලරත්න ඇතුලු අනෙකුත් වීරෝදාර රණවිරුවන් නවදෙනාගේ මතකය සිහිපත් කරමින් ඔවුන්ට උපහාර පුදකිරීමටද යුද්ධ හමුදාධිපතිතුමන් එක්විය. එහිදී එතුමන් අරාලිතුඩුවේ පිහිටි රණවිරු ස්මාරකය අභියස මල් කළඹක් තබා දිවිපිදූ එම වීරෝදාර රණවිරුවන් සිහිපත් කර ඔවුන්ට සිය ගෞරවාචාරය පුදකළේය. මෙම අවස්ථාව සඳහා යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ඇතුලු එම බලප්‍රදේශයේ රාජකාරී නියුතු සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරුන්, ඒකක අණදෙන නිලධාරීවරුන් ඇතුලු විශාල පිරිසක් සහභාගි වූහ.

# ගනර් සුපර්ක්‍රොස් - 2019









අඛණ්ඩව 14 වන වරටත් පැවති ගනර් සුපර්ක්‍රොස් - 2019 අභියෝගාත්මක මෝටර් රථ හා යතුරු පැදි ධාවන තරගාවලිය ඉකුත් ඔක්තෝම්බර් 06 දින ක්‍රීඩාලෝලීන් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් මින්නේරිය ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා ධාවන පථයේදී උත්කර්ෂවත්ව පැවැත්විණි. ශ්‍රී ලංකා මෝටර් රථ සහ යතුරුපැදි ධාවකයින්ගේ සංගමය සමඟ එක්ව සංවිධානය කරනු ලැබූ මෙම දැවැන්ත තරගාවලියේදී යතුරු පැදි හා මෝටර් රථ ධාවකයින් පැමිණ සිටි ක්‍රීඩාලෝලීන් දහස් ගණනක් මවිතයට පත්කිරීමට සමත්වූහ.

ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්පී ද සිල්වා වීඑස්වී යූඑස්පී එන්ඩියූ අයිජී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි වූ එම අවස්ථාවට තවත් සම්භාවනීය අමුත්තන් රැසක්ද එක්වූහ. සෑම වසරකම පවත්වනු ලබන මෙම දැවැන්ත තරගාවලියෙහි මුඛ්‍ය පරමාර්ථය වනුයේ ඉන් ලැබෙන ප්‍රතිපාදන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ සේවයේ නියුතු වීරෝදාර රණවිරුවන්ගේ සුබසාධන ව්‍යාපෘතීන් සඳහා යෙදවීමය.

# විරු සරණින් නව සෙවණක්





ඉනාමළු රොටරි ග්‍රාමයෙහි පදිංචි දරුවන් දෙදෙනෙකු සිටින අසරණ මවක් වෙනුවෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ මූලිකත්වය හා මගපෙන්වීම මත යුද්ධ හමුදාවේ ශ්‍රමදායකත්වයෙන් ඉදිකරනු ලැබූ "සිහින නිවස" ඉකුත් ඔක්තෝම්බර් 13 දින නිවාසලාභී දමයන්ති කුමාරි යන අය වෙත නිල වශයෙන් භාරදෙන ලදී.

53 සේනාංකය යටතේ ස්ථාපිත ඉංජිනේරු සේවා බලකායේ භටපිරිස් සහ එම සේනාංකය යටතේ සේවයේ නියුතු කණ්ඩායමකගේ ශ්‍රමදායකත්වයෙන් ඉදිකරන ලද මෙම නව නිවස ගෘහ භාණ්ඩ හා අනෙකුත් මූළුතැන්ගෙයි උපාංගවලින් සමන්විතය. මෙම නිවස භාරදීමේ අවස්ථාවට පරිත්‍යාගශීලීන්, විධායක ජෙනරල් මේජර් ජෙනරාල් ඒ් කොඩිප්පිලි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, 53 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීජේ ගමගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී, රාජ්‍ය නිලධාරීන් සහ ප්‍රදේශවාසීන් රැසක් සහභාගි වූහ.

# කෙළිබිමේ තරුවලට සුපැතුම්

වසර 7 කට පසු "ක්ලිෆර්ඩ් කුසලාන" තරගාවලියකදී රන්, රිදී පදක්කම් 5 ක් සහ ලෝකඩ පදක්කම් 6 ක් හිමිකර ගනිමින් "ක්ලිෆර්ඩ් කුසලාන" ශූරතාවය දිනා ගැනීමට යුද්ධ හමුදා බොක්සිං කණ්ඩායම සමත් වූහ. එහිදී කිලෝග්‍රෑම් 49 බර පන්තිය යටතේ 6 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකායේ ලාන්ස් කෝප්‍රල් එම්පීජීඑන් සජීව නුවන් හොඳම බොක්සිං ක්‍රීඩකයාට හිමි සම්මානය දිනාග ැනීමට සමත් වූ අතර, මීට පෙර ඔහු "ලේටන් කුසලාන" බොක්සිං ශූරතාවය හා 2018 වසරේ ජාතික බොක්සිං ශූරතාවලියේ හොඳම බොක්සිං ක්‍රීඩකයාද විය. ඩයන් ගෝමස් අභියෝගතා කුසලාන කාන්තා කාණ්ඩය සඳහා තරග වැදුණු 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායේ ලාන්ස් කෝප්‍රල් එච්එස් ප්‍රියදර්ශනී හොඳම කාන්තා පරාජිතයා ලෙස ඇගයීමට ලක් වූවාය.

එකී ජයග්‍රාහී කණ්ඩායම ඉකුත් ඔක්තෝම්බර් 15 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවූහ. එහිදී එම ක්‍රීඩකයින්ගේ විශිෂ්ට ජයග්‍රහණය පිළිබඳ යුද්ධ හමුදාධිපතිතුමාගේ උණුසුම් සුබපැතුම් හිමිවිය.








# යුද්ධ හමුදා විද්‍යාපීඨයට තොරතුරු තාක්ෂණ උපාංග ප්‍රදානයක්

ශ්‍රී ලංකාව සහ පකිස්තාන හමුදාව අතර පවතින ද්විපාර්ශවික සහයෝගීතාව සහ අවබෝධය තවදුරටත් ශක්තිමත් කරමින් ශ්‍රී ලංකාවේ පකිස්තානු මහකොමසාරිස් ගරු ආචාර්ය ෂාහීඩ් අහමඩ් හෂ්මාත් මහතා ඇතුලු පිරිසක් ඉකුත් ඔක්තෝම්බර් මස 02 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවූහ. එහිදී, දියතලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය වෙත නව පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර ඇතුලුව තොරතුරු තාක්ෂණ උපාංග රැසක්ද ඔවුන් විසින් ප්‍රදානය කරන ලදී.

# ශ්‍රී ලංකා ගුවන් සේවයෙන් අනුග්‍රහයක්

යුද්ධ හමුදා සාමාජිකයෝ සෑම වසරකම විදේශ පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ සහ වැඩමුලු සඳහා විවිධ රටවලට පිටත්ව යති. එසේ පිටත්වීමේදී මෙතෙක් ඔවුනට උපරිමයෙන් රැගෙන යා හැකිව තිබුණේ පුද්ගලික ගමන් මලුවලට අමතරව කිලෝ ග්‍රෑම් 30 ක බරක් පමණි. එහිදී යුද්ධ හමුදා සාමාජිකයින් රැගෙන යා යුතු අත්‍යවශ්‍ය උපාංග සහ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන ලෙස සේවය කරමින් සිටියදී යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා නොමිලේ රැගෙන යා හැකි ගමන් මලුවල බර ප්‍රමාණය වැඩි කරදෙන ලෙස ශ්‍රී ලංකා ගුවන් සේවයෙන් ඉල්ලීමක් කලේය. ඒ අනුව ශ්‍රී ලංකන් ගුවන් සේවයේ නියෝජිත කණ්ඩායමක් ඉකුත් සැප්තැම්බර් 26 දින යුද්ධ හමුදා හමුදාධිපති කාර්යාලයේදී යුද්ධ හමුදාධිපති හමුවී එම ඉල්ලීමට සිය අනුග්‍රාහකත්වය දක්වන ලදී.



# සුහද හමුවක සොඳුරු මතක



කොතලාවල ආරක්‍ෂක විශ්ව විද්‍යාලයේ උපකුලපති එයාර් වයිස් මාර්ෂල් එච්එම්එස්කේබී කොටකදෙණිය ඉකුත් ඔක්තෝම්බර් 04 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය.

මෙම සුහද සාකච්ඡාව අතරතුරදී කොතලාවල ආරක්‍ෂක විශ්ව විද්‍යාලයේ උපාධි පාඨමාලා සහ හමුදා වෘත්තියට අදාළ පුහුණු වැඩසටහන් පිළිබඳව විශේෂ අවධානය යොමුකරමින් පොදු කරුණු රැසක් පිළිබඳව දෙපාර්ශවය අතර සුහදව අදහස් හුවමාරු කරගත්හ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකායේ ආරාධනයකට අනුව දිවයිනට පැමිණි ඉන්දීය යුද්ධ හමුදාවේ යුධෝපකරණ බළකායේ කර්නල් සේනාවිධායක මෙන්ම යුධෝපකරණ සේවා අධ්‍යක්‍ෂ ජෙනරාල් ලුතිනන් ජෙනරාල් දිලීප් සිංග් රාතෝර් වීඑස්එම් ඉකුත් ඔක්තෝම්බර් 16 දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය.

යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුවූ එම සුහද හමුවේදී පොදු කරුණු පිළිබඳව මෙන්ම ඉන්දීය කර්මාන්ත කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ඉන්දීය යුද උපකරණ සැපයීම හා එහි නිෂ්පාදන අවශ්‍යතාව සම්බන්ධ අදහස් හුවමාරු කර ගන්නා ලදී.





ශ්‍රී ලංකාවේ මාලදිවයින් තානාපති අතිගරු ඔමර් අබ්දුල් රසාක් මහතා ඉකුත් ඔක්තෝම්බර් 07 දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය.

මෙම හමුවේදී දෙරට අතර පොදු කාරණා මෙන්ම හමුදා ආයතන අතර ද්විපාර්ශවික සබඳතා පිළිබඳව සුහදව අදහස් හුවමාරු කරගන්නා ලදී. යුද්ධ හමුදා මූලස්ථානය වෙත සපැමිණි මාලදිවයින් තානාපතිතුමන්ගේ සංචාරය අගයනු වස් යුද්ධ හමුදාධිපතිතුමන් එතුමන් වෙත සමරු තිළිණ ප්‍රදානයක්ද සිදුකරන ලදී.

# දිරිය දියණියන්ට විරිය ලැබදුන් මොහොතක්

උඩරට බෞද්ධ බාලිකාවියන් හට සිප්සතර ලබාදෙන මහනුවර පුෂ්පදාන බාලිකා විද්‍යාලයේ වර්ණ ප්‍රදානෝත්සවය ඉකුත් ඔක්තෝම්බර් 21 දින අති උත්කර්ෂවත් ලෙස පැවැත්විණ. එම උත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගිවූ අතර, එය ඔවුන් ලද සුවිශේෂී වරප්‍රසාදයක් විය. එහිදී ක්‍රීඩා හා විවිධ විෂය බාහිර ක්‍රියාකාරකම් තුළින් දක්ෂතා දැක්වූ ජයග්‍රාහී පුෂ්පදාන බාලිකාවියන් 400 කට යුද්ධ හමුදාධිපති සුරතින් සම්මාන ලබාගැනීමට හැකිවිය.














# ලෝක ළමා දිනය අර්ථවත්ව සමරයි





යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ සංවිධානත්වයෙන් එම බලප්‍රදේශයේ පිහිටි කට්කොලවම් එම්එම්ටීඑම් විද්‍යාලයේ පාසල් දරු දැරියන් උදෙසා වූ ළමා දින වැඩසටහනක් ඉකුත් ඔක්තෝම්බර් 04 දින පවත්වන ලදී. එහිදී එම විද්‍යාලයේ ගුරුවරුන්, දරු දැරියන් සහ ඔවුන්ගේ දෙමාපියන් ඇතුලු 70 දෙනෙකු සඳහා පලාලි ගුවන් තොටුපල නැරඹීමටත්, ඔවුන්ට "තල් සෙවණ" නිවාඩු නිකේතනයේ දී ළමා චිත්‍රපටයක් ප්‍රදර්ශනය කිරීමටත්, පොත්පත් බෙදාදීමටත් දිවා ආහාරය ලබාදීමටත් කටයුතු කරන ලදී. මෙම අවස්ථාව සඳහා යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී, ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) ආඥාපති ඇතුලු යුද්ධ හමුදා සාමාජික සාමාජිකාවන් විශාල පිරිසක්ද සහභාගී වූහ.

# විරු දෑතින් සෙවණක්





යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ගේ සුරතින් ඉකුත් ඔක්තෝම්බර් 07 දින අරියාලේ පුම්පුකාර් පෙරපාසල් ගොඩනැගිල්ල සඳහා මුල්ගල තැබිණ.

මෙම අවස්ථාව සඳහා 52 සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එස්එස් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී, ආරක්ෂක සේනා මූලස්ථානය බ්‍රිගේඩියර් ප්‍රමා බ්‍රිගේඩියර් පීජේපී ගමගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුලු යුද්ධ හමුදා නිලධාරීන්, සෙසුනිලයින් සහ පෙරපාසල් ගුරුවරුන් ඇතුලු පිරිසක් සහභාගී වූහ.





# යුද්ධ හමුදාධිපති වන්නියේ සංචාරයක

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සිය ධූරයේ රාජකාරී භාරගැනීමෙන් පසු ඉකුත් ඔක්තෝම්බර් 29 දින ආරක්ෂක සේනා මූලස්ථානය වන්නි හි සම්ප්‍රදායානුකූල සංචාරයක නිරත විය.



එහිදී නව යුද්ධ හමුදාධිපති වෙත හමුදා සම්මාන මැද අභිමානවත් පිළිගැනීමක් හිමිවිය. සිය සංචාරය තුළ යුද්ධ හමුදාධිපතිතුමා එම ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ පාලනය වන අංශ ආයතනවලට අයත් භට පිරිස් අමතන්නටද අමතක නොකළේය. තවද වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ උපදෙස් මත ක්‍රියාත්මක බුදෝ ආත්මාරක්ෂක සටන් කලාව හදාරනු ලැබූ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ ප්‍රදර්ශනාත්මක බුදෝ සටන් කලා සංදර්ශනයක්ද යුද්ධ හමුදාධිපතිතුමන් හමුවේ ඉදිරිපත් කිරීමටද කටයුතු යොදා තිබීම විශේෂත්වයකි.

# රූපලාවන්‍ය වැඩමුළුවක්



කොළඹ ප්‍රදේශය තුළ නවීන පහසුකම් සහිත උසස් තත්ත්වයේ රූපලාවන්‍යාගාරයක් ස්ථාපනය කිරීමේ අරමුණින් ඒ සඳහා කාන්තා සෙබළියන් රූපලාවන්‍ය ශිල්පිනියන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝම්බර් 22 දින ආරම්භ කරන ලදී. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයෙහි ගරු සභාපතිණිය සුජීවා නෙල්සන් මහත්මියගේ සංකල්පයකට අනුව සිදුකෙරෙන මෙම කටයුත්ත සඳහා රමණී ප්‍රනාන්දු රූපලාවන්‍ය ඇකඩමිය වෙතින් සයමාසික පුහුණු පාඨමාලාවක් හැදෑරීමට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ කාන්තා සෙබළියන් 12 දෙනෙකු හට අවස්ථාව ලබාදී ඇත. පාඨමාලාවේ සමාරම්භක දිනයේ විශේෂ අවස්ථා මෙහි දැක්වේ.





# යුද්ධ හමුදාධිපති කිලිනොච්චියට






යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් ඔක්තෝම්බර් 18 සහ 19 දෙදින තුළ කිලිනොච්චි ආරක්ෂක සේනා මූලස්ථානයේ සිය ප්‍රථම නිල සංචාරයේ නිරත විය. එහිදී කිලිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීවී රවිප්‍රිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ අයිජී විසින් යුද්ධ හමුදාධිපතිතුමන්ව ඉතා උණුසුම් අයුරින් පිළිගන්නා ලද අතර, එහිදී යුද්ධ හමුදාධිපති වෙත 3 වන ගජබා රෙජිමේන්තුවේ හටපිරිස් විසින් කඳවුරු සම්මාන මුරයක් හා ආචාර පෙළපාලියක්ද පිරිනමන ලදී.

එම සංචාරයේදී කිලිනොච්චි සහ මුලතිව් ආරක්ෂක සේනා බලප්‍රදේශවලට අයත් ඉඩම් අක්කර කිහිපයක් කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් හා මුලතිව් දිස්ත්‍රික් ලේකම් වෙත භාරදීමද, පුනරුත්තාපනය කර සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් 15 දෙනෙකු වෙත සූර්ය පැනල්, පාපැදි, ඇතුළු උපකරණ පරිත්‍යාග කිරීමද, ඔවුන්ගේ දරුවන් 20 දෙනෙකු හට කිලිනොච්චි ලංකා බැංකුවේ ගිණුම් ආරම්භ කරදීමද යුද්ධ හමුදාධිපතිතුමා අතින් සිදුකෙරිණි.

# අංගම්පොර මූලික පුහුණු පාඨමාලාව ආරම්භ කරයි





කිලිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීවී රවිප්‍රිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ අයිජී ගේ සංකල්පයකට අනුව කිලිනොච්චි බලප්‍රදේශය තුළ රාජකාරියෙහි නියුතු යුද්ධ හමුදා සාමාජිකයන් හට අංගම්පොර සටන් කලාව පිළිබඳ මූලික පුහුණු පාඨමාලාවක් ඉකුත් සැප්තැම්බර් 03 දින ආරම්භ කරන ලදී. මෙම පාඨමාලාව 2019 සැප්තැම්බර් 03 දින සිට 2020 ජනවාරි 02 දින දක්වා කිලිනොච්චිය දසබල රාවණා පර්යේෂණ හා සංරක්ෂණ ගම්මානයේදී පවත්වනු ලබයි.

රිටිගල සිංහක්කාර පරපුරේ කලාකීර්ති කලාවිභූෂණ දේවින්ද ලක්සිරි රණසිංහ මහතා විසින් මෙහෙයවනු ලබන මෙම පාඨමාලාවේ සහය සඳහා යුද්ධ හමුදා සාමාජිකයින් තිස්දෙදෙනෙකු සහභාගී වී සිටිති. මෙම පාඨමාලාවේ ආරම්භය සනිටුහන් කිරීම වස් කිලිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති සහභාගී වූ අවස්ථාවෙහි විශේෂ මතක සටහන් මෙහි දැක්වේ.





# ජන සෙතට විරු සහන

නැගෙනහිර ආරක්‍ෂක සේනා මූලස්ථානය විසින් දියත් කරනු ලබන මානුෂීය ව්‍යාපෘතීන් තවදුරටත් පුළුල් කරමින්, එහි ආඥාපති මේජර් ජෙනරාල් කේපීඒ ජයසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී සහ එම පවුලේ සාමාජිකයින්ගේ අනුග්‍රහය ඇතිව වැලිකන්ද පෙර පාසලේ ඉගෙනුම ලබන ළමුන්ගේ අවශ්‍යතාවන් වෙනුවෙන් පාසල් පොත් තොගයක් පරිත්‍යාග කරනු ලැබීය. ඉකුත් ඔක්තෝම්බර් 05 දින වැලිකන්ද බෞද්ධ මධ්‍යස්ථානයේදී සිදුකළ මෙම මානුෂීය කටයුත්තට සමගාමීව වැලිකන්ද නව ගම්මානයෙහි පදිංචි අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන් වෙත පාසල් උපකරණ සහ වියළි සලාක පාර්සල් තොගයක්ද බෙදාදෙන ලදී.

# ගෞරවාන්විත සමුගැනීමක්

නැගෙනහිර ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේපීඒ ජයසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී සිය ධූරයෙන් නික්මයාමට ප්‍රථම ඉකුත් ඔක්තෝම්බර් 07 සහ 08 යන දෙදින එම ආරක්‍ෂක සේනා බලප්‍රදේශයේ සංචාරයක නිරත විය. එහිදී ඔහු 22, 23 සේනාංක, ඉදිරි තඩත්තු පෙදෙස (නැගෙනහිර), 224, 231 යන බලසේනාවන්හි සංචාරය කළේය. එහිදී යුද්ධ හමුදා දිවියෙන් නික්මයන ආඥාපති වෙත ගෞරවනීය බුහුමන් හිමිවිය.



තවද මඩකලපුව මංගලාරාමයේ විහාරාධිපති අම්පිටියේ සුමනරතන හිමි, මඩකලපුව මාමංග පිල්ලෙයාර් කෝවිලේ පූජකතුමන්, මඩකලපුව දිස්ත්‍රික් ලේකම් එම් උදය කුමාර මහතා සහ නැගෙනහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එච්ඩීකේඑස් කපිල ජයසේකර මහතා ද ආඥාපතිතුමන් වෙත සුබපැතුම් එක්කළේය.





# බළඇණි පුහුණු පාසල සුබ මොහොතින් සෙසුනිල අයිතියට









59 සේනාංකයට දීර්ඝකාලීනව පැවති අවශ්‍යතාවක් සපුරාලමින් ඉදිවූ බළඇණි පුහුණු පාසල පසුගියදා විවෘත කෙරිණ. 59 සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් කේඑච්පීපී ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ ආරාධනයකට අනුව මුලතිව් ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් එය විවෘත කරන ලදී. එම අවස්ථාව සඳහා 64 සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී ද ඇතුළු විශාල පිරිසක් සහභාගි වූහ.

අභිනවයෙන් ඉදිකළ මෙම බළඇණි පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක ලෙස ලුතිනන් කර්නල් යූඩීකේ ෆෙඩ්රික් කටයුතු කරනු ලබන අතර, එහි ප්‍රථම පාඨමාලාව වශයෙන් 24 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු බළඇණි පුහුණු පාඨමාලාව ආරම්භ කරන ලදී.

# වොලිබෝල් ක්‍රීඩාව ඔප්නැංවීමට පුහුණු වැඩමුළුවක්






මුලතිව් දිස්ත්‍රික්කයේ සිවිල් ජනතාව හා යුද්ධ හමුදාව අතර, සංහිඳියාව වර්ධනය කිරීමේ තවත් පියවරක් ලෙස හා ප්‍රදේශයේ වොලිබෝල් ක්‍රීඩාවේ නියැළී සිටින පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන් සහ උපදේශකයින්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීමේ අරමුණින් වූ වොලිබෝල් පුහුණු කඳවුරක් ආරක්‍ෂක සේනා මූලස්ථානය මුලතිව් ක්‍රීඩාංගනයේදී ඉකුත් ඔක්තෝම්බර් 04 සහ 05 යන දෙදින පවත්වන ලදී.

මුලතිව් ආරක්‍ෂක සේනා මූලස්ථානයේ සංවිධායකත්වයෙන් සිදුකෙරුණු මෙම පුහුණු කඳවුර සඳහා මුලතිව් දිස්ත්‍රික්කයේ පාසල් සහ ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් වොලිබෝල් ක්‍රීඩා උපදේශකයින් 49 ක් සහ පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 350 ක් සහභාගී වූහ. එහි අවසන් පුහණු සැසිවාරය සඳහා 64 සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී ගේ ආරාධනයට අනුව මුලතිව් ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගි විය.





# යුද්ධ හමුදා ජනපදයට නව ඉදිකිරීමක්



පනාගොඩ යුද්ධ හමුදා ජනපදයෙහි වසර 70 ක් පැරණි ප්‍රධාන පිවිසුම් දොරටුව දෙපස ස්ථාපිත දෛනික වාහන සංගනණ ඒකකය සහ පදික මංතීරු වර්තමානයට ගැළපෙන පරිදි අභිනවයෙන් ඉදිකරන ලදී. එය බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූගේ සුරතින් පසුගිය ඔක්තෝම්බර් 10 වන දින විවෘත කෙරිණ. යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව සුබ මොහොතින් නිරාවරණය කරන ලද එම වාහන සංගනණ ඒකකයත් සහ පදික මංතීරු විවෘත කිරීමේ අවස්ථාවට ආරක්ෂක සේනා මූලස්ථානයේ රාජකාරී නියුතු නිලධාරීන්, නිලධාරිණියන් සහ සෙසු නිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.



# කෙළිබිම දිනන්නට යුද්ධ හමුදාවෙන් අතහිත

පසුගියදා පැවති 56 වන යුද්ධ හමුදා මලල ක්‍රීඩා ශූරතාවලියේදී රන් පදක්කම් දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත නව ක්‍රීඩා පාවහන් ප්‍රදානය කිරීම බටහිර ආරක්ෂක සේනා ආඥාපති මෙන්ම යුද්ධ හමුදා මලල ක්‍රීඩා සංගමයේ සභාපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් සිදුකරන ලදී.

මෙම ක්‍රීඩා පාවහන් ප්‍රදානය කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පාබල රෙජිමේන්තුව විසින් මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදෙනු ලැබීය.





# ඒකක සංචාරයක්



ආරක්ෂක සේනා මූලස්ථානය මධ්‍යම ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී වීඑස්වී එන්ඩීයූ ඉකුත් ඔක්තෝම්බර් 21 දින එම මූලස්ථානය යටතේ පාලනය වන 8 ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ සංචාරයක නිරත විය. එම ඒකකයේ වත්මන් රාජකාරීන් පිළිබඳ සොයා බැලීමත්, ඔවුනගේ අවශ්‍යතා සපුරාලීමත් ආඥාපතිගේ එම සංචාරයේ අරමුණ විය.




## යල අස්වනු පූජාවට යුද්ධ හමුදා සහය





වාර්මාර්ග හා ජල සම්පත් ආපදා කළමණාකරන අමාත්‍යංශය වෙතින් සහ ගොවි මහතුන් 3000 කගේ සහභාගීත්වයෙන් සංවිධානය කරන ලද යල අස්වනු පූජාව ඉකුත් ඔක්තෝම්බර් 03 දින ශ්‍රී දළදා මාළිගා පරිශ්‍රයේදී පවත්වන ලදී. එම කටයුත්ත සඳහා 11 සේනාංක මූලස්ථානය හා ඒ යටතේ පාලනය වන ඒකක වෙතින් හටපිරිස් සහභාගී වූහ. එහිදී ඊට එක්වූ ගොවි මහතුන් සඳහා පැවැත්වූ දිවා දන්සැල වෙනුවෙන් කූඩාරම් ඉදිකිරීම, ආහාර සැකසීමේ කටයුතු මෙන්ම ආහාර බෙදාදීම් කටයුතු ආදී සියල්ල එම හටපිරිස්වල දායකත්වය මත සිදුකිරීම විශේෂත්වයකි.

# අලුත උපන් බිලිඳුන්ට යුද්ධ හමුදාවෙන් තිළිණ

70 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහලේ ඉකුත් ඔක්තෝම්බර් 10 දින උපන් බිළිඳුන් 07 දෙනෙකු වෙනුවෙන් ස්වර්ණාභරණ ප්‍රදානය කිරීමේ උත්සවයක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණි සුජීවා නෙල්සන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ඔක්තෝම්බර් මස 11 දින එම රෝහල් පරිශ්‍රයේදී සිදුකෙරුණි.

ඒ අනුව එදින උපන් පුතණුවන් දෙදෙනෙකු වෙත එක් අයෙකු සඳහා එකක් රු. 11,500.00 ක් බැගින් වූ පංචායුධ හා, දියණියන් පස් දෙනෙකු හට එකක් රු. 8,500.00 ක් බැගින් වූ කරාබු යුවල් ත්‍යාග වශයෙන් ලබාදෙනු ලැබිය. මෙම උත්සවය යුද්ධ හමුදා සුබසාධක අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සංවිධානය කරනු ලැබූ අතර, රාජා ජුවලර්ස් - බම්බලපිටිය ශාඛාව වෙතින් ඒ සඳහා අනුග්‍රහය ලබාදෙන ලදී.







# ලෝක ළමා දිනයට අර්ථවත් සැමරුමක්



ඉකුත් ඔක්තෝම්බර් 01 දිනට යෙදුණු ලෝක ළමා දින සැමරුම, යුද හමුදා සේවා වනිතා ඒකකයෙහි ගරු සභාපතිණි සුජීවා නෙල්සන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්විණ. එහිදී සියලුම ළමුන්ට තම සෞන්දර්යාත්මක හැකියාවන් ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාව උදාවූ අතර, එම උත්සවය අවසානයේදී ඔවුනට ත්‍යාග පාර්සල් බෙදාදීමටද සේවා වනිතා සාමාජිකාවෝ කටයුතු යෙදූහ.








## යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව

යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය ෆෙඩ්රික් අතපත්තු මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගියදා ප්‍රජාසත්කාරක වැඩසටහන් රැසක් දියත් කරන ලදී. එහිදී දඹුල්ල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන පරිවාස හා ළමා නිවාසයේ නේවාසික දියණියන්ගේ සුවදුක් සොයාබැලීමේ සංචාරයක නිරතවූ ඇය, රණවිරු සෙවණ - රාගම නේවාසික රණවිරුවන්ගේ සුවදුක් විමසා බැලීමටද එක් වූවාය.


## කමාන්ඩෝ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව





කමාන්ඩෝ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය අනූජා ද සිල්වා මහත්මිය හා එහි ජ්‍යෙෂ්ඨ සාමාජිකාවෝ ඉකුත් සැප්තැම්බර් 21 දින අත්තිඩිය මිහිඳු සෙත් මැඳුරෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් විමසීම සඳහා සංචාරයක නිරත වූහ. එහිදී ඔවුන් හට ත්‍යාග පිරිනැමීමටද කටයුතු කළ අතර, එතෙක් එහි අවශ්‍යතාවක්ව පැවති ඉන්ඩස්ට්‍රියල් ෆෑන් 02 ක්ද ප්‍රදානය කරන ලදී. මෙම සංචාරය සඳහා කමාන්ඩෝ රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුලු නිලධාරීන් රැසක්ද සහභාගී වූහ.

## ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාව



ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය තුෂාරි කුලතුංග මහත්මිය සිය ධූරයෙන් සමුගැනීමෙන් අනතුරුව එහි නව සභාපතිනිය ලෙස ත්‍රිෂානි මුදලිගේ මහත්මිය පසුගියදා සුබ මොහොතින් වැඩ භාරගන්නා ලදී.




## ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකා සේවා වනිතා ශාඛාව

යුද්ධ හමුදා වෛද්‍ය බළකා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය බ්‍රිගේඩියර් ඩීටීඑන් මුණසිංහ යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් එම ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් පිරිසක් ඉකුත් ජූලි 24 දින වැල්ලවත්ත ශ්‍රී ජිනානන්ද ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ සංචාරයක නිරතවූහ. එහි නේවාසික පිරිමි දරුවන්ගේ සුවදුක් විමසා බැලීමේ අරමුණින් සිදුකෙරුණු එම සංචාරයේදී අදාළ දරුවන් වෙනුවෙන් ප්‍රණීත දිවා ආහාර වේලක් ලබාදීමට හා ඔවුනට පාවහන් ඇතුලු පාසල් උපකරණ පරිත්‍යාග කිරීමටද කටයුතු කරන ලදී.




## ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස්හේවා බළකා සේවා වනිතා ශාඛාව

යුද්ධ හමුදා පොලිස් හේවා බළකායේ වාර්ෂික පාසල් උපකරණ බෙදාදීමේ උත්සවය ඉකුත් ඔක්තෝම්බර් 13 දින එම රෙජිමේන්තු බළකාධිපති මෙන්ම හකාස අණසක ආඥාපති මේජර් ජෙනරාල් ඩීකේජීඩී සිරිසේන යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.




## ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු සේවා වනිතා ශාඛාව

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු සේවා වනිතා ශාඛාවේ සභාපතිණිය අනෝමා රණවක මහත්මිය ඇතුලු සාමාජිකාවෝ ඉකුත් සැප්තැම්බර් 28 දින අභිමංසල 3 සුවසහන මධ්‍යස්ථානයේ සංචාරයක නිරත වූහ. මෙම අවස්ථාවට එම රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩීප්ආර් රණවක ආර්එස්පී එන්ඩියූ අයිජී ද එක්විය. එහිදී රණක්ෂිතයට පත් නේවාසික රණවිරුවන් සඳහා තේ පැන් සංග්‍රහයක් සහ දිවා භෝජන සංග්‍රහයක් පිරිනැමීම, සුවසහන මධ්‍යස්ථානයෙහි ප්‍රයෝජනය සඳහා වීදි ලාම්පු ප්‍රදානය කිරීම, රණක්ෂිතයට පත් විරුවන් 38 ක් සඳහා ත්‍යාග පාර්සල් පිරිනැමීම සිදුකෙරුණු අතර, ඔවුන්ගේ මානසික සුවය හා විනෝදාස්වාදය වෙනුවෙන් එහි සංගීත ප්‍රසංගයක්ද පවත්වන ලදී.

# දරුවාගේ නව යොවුන්විය සම්බන්ධව දෙමාපියන් විමසිලිමත්වීමේ අවශ්‍යතාවය

දරුවාගේ කුඩා අවධිය දෙමාපියන්ට හා වැඩිහිටියන්ට කීකරුය, අවනතය. එහෙත් නව යොවුන් අවදියට පත්වීමේදී මෙම ගති ලක්‍ෂණ ක්‍රමයෙන් වෙනස් වේ. දරුවා ළමාවියේ සිට වැඩිහිටි වියට පැමිණෙන වර්ධන අවධිය නව යොවුන් අවධිය යනුවෙන් හැඳින්වේ. මෙම වකවානුවේදී දරුවන්ගේ කායික හා මානසික වර්ධනය වේගයෙන් සඳුවන අතර සමාජීය හා සදාචාරය පිළිබඳව හැගීම්ද ඒ සමගම වර්ධනය වේ. සාමාන්‍යයෙන් ගැහැණු දරුවෙකු නව යොවුන් වියට පිවිසෙන්නේ ප්‍රථම වතාවට ඔසප් චක්‍රය ආරම්භ වීමත් සමග වන අතර එය මල්වරවීම, වශයෙන් හඳුන්වයි. එමෙන්ම පිරිමි දරුවෙකුගේ කටහඬ වෙනසවීම වැනි ලක්‍ෂණ වලින් යෞවන වියට එළඹීම සිදුවේ. නමුත් එක් එක් දරුවන්ගේ විවිධ වෙනස්වීම් මත ගැහැණු දරුවන් මෙන්ම පිරිමි දරුවන්ද අසවල් වයසේදී නව යොවුන් වියට පත් වන්නේ යැයි ස්ථිර වශයෙන් සඳහන් කළ නොහැක.

කෙසේ හෝ නව යොවුන් විය දරුවන්ගේ ජීවිතයේ වැදගත්ම අවදිය වශයෙන් සැලකේ. එනම් ලිංගික අවයව වර්ධනය ආරම්භ වන අවධියේදී පිටියුටරි ග්‍රන්ථියේ හෝමෝන ක්‍රියාකාරීත්වය එක්වරම වැඩි වන අතර එය තයිරොයිඩ් ග්‍රන්ථියට හා ලිංගික ග්‍රන්ථි වලට බලපෑනු ලබයි. ඒ අනුව ශරීරයේ උස මහත් වීම මාංශපේශීන් හා අස්ථි වර්ධනය වීම ඉක්මණින් වැඩි වන අතර එය එතෙක් වර්ධනය වූ වේගයට වඩා දෙගුණයක වැඩිවීමක් වශයෙන් සිදුවන බව පර්යේෂණයැයින් සඳහන් කරනු ලබයි. ලිංගික හෝමෝන ශ්‍රාවය වීම වැඩිවී ලිංගික ග්‍රන්ථිවලට හා ලිංගික ඉන්ද්‍රියන්වලට සිදු වන බලපෑම තුලින් ලිංගික පරිනතියක්ද මෙහිදී සිදුවේ. එමෙන්ම ස්වස්තික ලිංගික ලක්‍ෂණ පහළවීමත් සමග ලිංගාශ්‍රිත ප්‍රදේශය හා කිහිලිවල රෝමකූප වර්ධනය වන අතර පිරිමි දරුවන්ගේ රැවුල වර්ධනය වීම කටහඬ වෙනස්වීම ගැහැණු දරුවන්ගේ පියයුරු, උකුල වැඩීම මෙන්ම ශරීර හැඩයද වෙනස් වෙමින් ලිංගිකත්වය පිළිබඳ හැගීම්ද පහල වීම සිදුවේ.

භාවාත්මක චින්තනය වර්ධනය වන මෙම අවධියේදී වැඩිහිටියන් මෙන් තර්ක විතර්ක ඉදිරිපත් කිරීමේ බුද්ධියද තමන් පිළිබඳ සංවේදී වන ස්වභාවයද මතුවේ.

එම නිසා තමන් සිතන ආකාරයට අන් අයද සිතන බවට විශ්වාසයක් ඔවුන් තුළ ජනිත වේ. එසේම සමාජීය සංවර්ධනයද සිදුවන මෙම වකවානුවේදී නිදහස වඩාත් ප්‍රිය කරන අතර මිතුරු ඇසුරටද ප්‍රිය වෙති. ඒ සමගම විරුද්ධ ලිංගිකයන් සමග සම්බන්ධකම් පැවැත්වීම පිළිබඳ සිතිවිලිද මෙම වයසේදී දරුවන් තුළ ජනිත වේ.

මෙයට පෙර මෙන් දෙමාපියන් හා ගුරුවරුන් කියන ලද දෙයක් එලෙසම පිළිනොගන්නා අතර, එය විශ්ලේෂණය කර එහි ප්‍රතිඵලය අනුව තීරණයට එළඹීමට උනන්දු වේ. තමාගේ අනන්‍යතාව හා තමාගේ අනුගතය කෙසේ විය යුතුද සිතනු ලබන්නේත් මෙම අවදියේය. මෙහිදී වැරදි අවබෝධයක්, අර්බුදයක් මතු වුවහොත් ඒ පිළිබඳව අසතුටකින් වැරදි ආකාරයෙන් ඉක්මන් තීරණ වලට එළඹීම සිදුවෙනවා මෙන්ම දෙමාපියන් කියන කරන දේ නිවැරදි යැයි මුලින් සිතා එය වැරදුණු විට පීඩාවටද පත්වේ. ඒ අනුව දරුවන් නව යොවුන් වියට එළඹුණු පසු දෙමාපියන් ඔවුන් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ආකාරය ඉතා වැදගත් වේ.

යොවුන් විය යනු දරුවා කුඩා ළමයෙකුත් නොවන වැඩිහිටියෙකුත් නොවන කාල පරාසයයි. ඒ අනුව නව යොවුන් දරුවා සම්බන්ධයෙන් මේ දෙකෙන් කොයි ආකාරයකට සිතුවත් නිවැරදි නොවේ. මෙහිදී දරුවා තමන් කවුද යන්න තේරුම් ගනිමින් සිටින අවදියයි. ඒ සඳහා දරුවාට යම් නිදහසක් තිබිය යුතු ය. එමෙන්ම නිසි මග පෙන්වීමක්ද කළ යුතු වේ. එසේම කුඩා අවධියේ මෙන් මෙම අවධියේදී උපදෙස් දීමෙන් පමණක් හොඳක් නොවන අතර උපදෙස් දෙන විට හේතු කාරණා ඇතිව තේරුම් කරදීම අවශ්‍යවේ. නව යොවුන් වියේ දරුවන් සමඟ ඉතා සුහද මට්ටමින් කෙරෙන සාකච්ඡා මාර්ගයෙන් එකඟත්වයට එළඹීම සුදුසු වේ.

එහෙත් මෙම වයසේ දරුවන් හට වඩවඩාත් නිදහස නොදිය යුතුය. යම් ප්‍රමාණයකින් නිදහසක් දෙමින් නිතර අධීක්‍ෂණය කරමින් ප්‍රවේශමෙන් ඔවුන් සමඟ කටයුතු කළ යුතු වේ. මේ අවධිය අවදානම් වැඩිම අවදියයි. මෙම කාලපරිච්ඡේදයේදී නොයෙකුත් ගැටලු වලට ඔවුන් මුහුණපාති. දෙමාපියන්ගෙන් හා වැඩිහිටියන්ගෙන් ලැබෙන ආදරය සෙනෙහස ප්‍රමාණවත් නොවන බව හැඟෙන්නේනම් හෝ සමීප බව නොමැති බව දැනෙන්නේනම් එම අඩුව වෙනත් අය වෙතින් පිරිමසා ගැනීමට මෙම දරුවන් උත්සහ කරනු ඇත. බොහෝවිට තමන්ට වඩා බොහෝ සෙයින්



## දරුවාගේ නව යොවුන්විය

වැඩිමහල් පිරිමින් සමඟ ඇසුරට පත්වන්නේ මෙවැනි හේතූන් මතය. ඔවුන් තමාව බලා ගනීවි යන ආකල්පයක් මෙම දරුවන් තුළ ජනිත වේ. එසේම ඇතැම් දරුවන් හට තම අනන්‍යතාවය පිළිබඳව ගැටලු මතු විය හැකි බවද ඉහතදී සඳහන් කළෙමි. එබඳු සමහර පිරිමි දරුවන් මද්‍යසාර, දුම්වැටි ආදියට ඇබ්බැහිවීමට තිබෙන ඉඩ ප්‍රස්ථාව බහුලය. එසේම මෙම දරුවන් දුසිරිත්වලට නැඹුරුවීමට ඇති ඉඩකඩද බහුලය. ඒවැනි දේ වලට නැඹුරු වූ වැඩිහිටියන් බහුතරයක්ම ඊට යොමුවී සිටින්නේ නව යොවුන් වසසේදීය. මෙම කාලයේදී මොලය නමැති ඉන්ද්‍රිය සකස් වන අවදිය නිසා ස්නායු පද්ධතිය ඒවාට අනුගතවීම වැඩි වේ. එසේ වුවහොත් එම පුරුදු නැතිවම බැරි තත්ත්වයට පත් වේ.

මෙම අවධියේදී දරුවාට ඇතිවන ගැටලු වලට දෙමාපියන් අවබෝධයකින් යුක්තව උපකාර කළයුතු වේ. නොමැති වුවහොත් දරුවා මානසික අසහනවලට පවා පත්වේ. මෙම තත්ත්වයෙන් දරුවා මුදවා ගැනීමට නම් දෙමාපියන් හා ගුරුවරුන් අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුක්තව මිතුරු මට්ටමින් දරුවන්ට මගපෙන්වීම තුළින් ඔවුන්ගේ අනාගත අභිවෘද්ධියට මහගු පිටුවහලක් සිදු වන බව නොඅනුමානය.



කර්නල් ඒවීඑස් ආරියරත්න ආර්එස්පී
ශාස්ත්‍රපති (බෞද්ධ මනෝ උපදේශනය - කැළණිය)
ජ්‍යෙෂ්ඨ මනෝවිද්‍යා උපදේශක
යුද්ධ හමුදා නිවාරණ හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂක මණ්ඩලය



# බුහුමන් මැදින් අභිමන් ගමනක 70 වෙනි යුද්ධ හමුදා සංවත්සරය





යුද්ධ හමුදාවේ අභිමානවත් 70 වන සංවත්සරය ඉකුත් ඔක්තෝම්බර් 10 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති සංවත්සර සැමරුම් උත්සවය ගාලු මුවදොර පිටියේදී පැවැත්විණ. 2000 ක පමණ යුද්ධ හමුදා භටපිරිසකගෙන් සැදුම්ලත් සන්නද්ධ පෙළපාළියකින් වර්ණවත් වූ එම අවස්ථාව යුද්ධ හමුදාවේ ප්‍රෞඪත්වය හා අභිමානය කදිමට කියාපෑ අවස්ථාවක් විය. සම්භාවනීය ආරාධිත අමුත්තන්, ආරක්ෂක අංශ සාමාජිකයින් ඇතුළු විශාල පිරිසක් එම ඓතිහාසික අවස්ථාවට එක්වූහ.







# පිං බිමෙහි ආශිර්වාද ලැබූ වගයි





ඉකුත් ඔක්තෝම්බර් 10 දිනට යෙදී තිබූ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අභිමානවත් 70 වන සංවත්සරය නිමිත්තෙන් යුද්ධ හමුදා ධජයන්ට සෙත් පැතීමේ චාරිත්‍රානුකුල උත්සවය අනුරාධපුර ජය ශ්‍රී මහා බෝ සමිඳුන් අභියසදී සහ කතරගම ඓතිහාසික කිරිවෙහෙර අභියසදී පැවැත්විණ. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදුකළ එම පුණ්‍ය කටයුත්තේදී යුද්ධ හමුදාවේ සියලු අංශ ආයතන නියෝජනය කරමින් ඒ ඒ ධජයන්ට සෙත් පැතීම ගරුතර මහා සංඝරත්නයේ සෙත් පිරිත් සජ්ඣායනා මධ්‍යයේ සිදුවිය. යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන. නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන ඇතුලු ජ්‍යෙෂ්ඨ කණිෂ්ඨ නිලධාරීන් සහ සෙබලුන් විශාල පිරිසක්ද මෙම පුණ්‍යවන්ත කටයුත්තට එක්වූහ.









# විරු හිතට දිරියක්

අභිමංසල පාන්ගොල්ල හි ප්‍රතිකාර ලබමින් සිටින රණවිරුවන්ගේ සුවදුක් බැලීම සඳහා 11 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑච්ඒඑස් බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඇතුලු පිරිසක් ඉකුත් ඔක්තෝම්බර් 10 දින සංචාරයක නිරත වූහ. 70 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව සිදුකෙරුණු මෙම සංචාරයේදී එම රණවිරුවන් වෙත ත්‍යාග පාර්සල් ලබාදීමටද කටයුතු කරන ලදී. තිස් වසරක කුරිරු ත්‍රස්තවාදය මුලුමනින්ම තුරන් කිරීමට ඇපකැප වූ එකී රණවිරුවන්ගේ මෙහෙවර එලෙස ඇගයීමට ලක්වීම, එම රණක්ෂිතයට පත් සියලු රණවිරුවන්ට ඉමහත් උද්දාමයට හේතු විය.



# කෝමාරිකා වගාව පිළිබඳ වැඩමුලුවක්







කිලිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති ගේ සංකල්පයකට අනුව සිවිල් ජනතාවගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින්, හඳබිම අධිකාරියේ උපදේශකත්වයෙන් ක්‍රියාත්මක කෝමාරිකා වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝම්බර් 04 දින 65 වන සේනාංක මූලස්ථානයේදී පවත්වන ලදී.

65 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව් කුමාරප්පෙරුම යූඑස්පී ගේ අධීක්ෂණයෙන් සිදුකෙරුණු මෙම කටයුත්ත හරහා යුද්ධ හමුදා සාමාජිකයින් පුහුණු කර ඔවුන් ලවා සිවිල් ජනතාව දැනුවත් කරවීමට අපේක්ෂිතය. මෙම අවස්ථාවට ඉදිරි නඩත්තු පෙදෙස ආඥාපති මේජර් ජෙනරාල් ඒඩී ඇල්වත්ත සහ කිලිනොච්චි බලප්‍රදේශයේ ඇති සේනාංක, බලසේනා, ඒකක නියෝජනය කරමින් නිලධාරීන් 04 ක් සහ සෙසුනිලයින් 49 දෙනෙක් සහභාගී වූහ.

# වෙරළ පවිත්‍රතාවයට රණවිරුවන් මුල්වෙයි





මාතර 3(සෙව්) ගැමුණු හේවා බළඇණි ඒකක බලප්‍රදේශය තුළ පිහිටා ඇති දර්ශනීය වෙරළ තීරය සංචාරක කර්මාන්තයේ දියුණුව සඳහා මහත් පිටුවහලක් වී ඇත. සංචාරකයින් බහුලව ගැවසෙන එහි වැලිගම වෙරළ තීරය පවිත්‍ර කිරීමේ ප්‍රජාසත්කාර වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 05 දින රණවිරුවන්ගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කරන ලදී. රටේ ආර්ථිකයට යුද්ධ හමුදාවේ දායකත්වය ලබාදීමේ අරමුණින් බටහිර ආරක්ෂක සේනා ආඥාපති ගේ සංකල්පයකට අනුව 58 සේනාංකයේ සේනාංකාධිපති ගේ අධීක්ෂණයෙන් සිදුකෙරුණු මෙම සත්ක්‍රියාවට 581 බලසේනාවේ බලසේනාධිපති, 3(සෙව්) ගැමුණු හේවා බළඇණියේ ඒකක අණදෙන නිලධාරී, අනෙකුත් නිලධාරීන්, සෙසුනිලයින්, ප්‍රදේශයේ රාජ්‍ය ආයතන සහ ස්වේච්ඡා සංවිධානවල නියෝජිතයින් ඇතුලු විශාල පිරිසක් සහභාගී වූහ.



# අන්තර් රෙජිමේන්තු කායවර්ධන, බර ඉසිලීමේ හා සවි එසවීමේ තරඟාවලිය - 2019

"අන්තර් රෙජිමේන්තු බර ඉසිලීමේ සහ සවි එසවීමේ තරඟාවලිය - 2019" ඉකුත් ඔක්තෝම්බර් 01 හා 02 යන දිනයන්හිදී පනාගොඩ ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී අතිඋත්කර්ෂවත් ලෙස පැවැත්විණි. ඔක්තෝබර් 03 පැවති එහි අවසන් දින ජයසංකේත ප්‍රදානෝත්සවයේ ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදා පර්යේෂණ, විශ්ලේෂණ, යෝජනා හා සංවර්ධන ශාඛාවේ අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් ඩීආර් ධර්මසිරි යූඑස්පී එච්ඩීඑම්සී සහභාගි විය. යුද්ධ හමුදා කායවර්ධන සවි එසවීම සහ බර එසවීමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගෙවුණු වසර 05 ක කාලසීමාවක සිට ජාතික හා ජාත්‍යන්තර පදක්කම් දිනාගනිමින්, නව තරඟ වාර්තා බිහිකරමින් එම ක්‍රීඩාවන් මෙරට තුළ ඉහළට ඔසවා තබන්නට සමත්වී ඇත. එහිදී එම ක්‍රීඩා කමිටුවේ වත්මන් සභාපති අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් පීඩබ්ලිව්ජීජේකේ විජේසුන්දරද එකී කටයුතු වෙනුවෙන් ලබාදුන් දායකත්වය වෙසෙසින් අගය කළ යුතුය.



**දක්ෂතම බර ඔසවන්නා**
සෙ/ඕ103055 ලා/කෝ කුමාර වයිඩීඅයි
(ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බළකාය)




**දක්ෂතම බර ඔසවන්නිය**
සෙ/2018 ඩබ්එෆ්ආර්ඩී 97472
ආකාසෙ චන්ද්‍රතිලක කේඑස්එම්
(ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බළකාය)



**දක්ෂතම කායවර්ධන ක්‍රීඩකයා**
සෙ/578134 මා/සැරයන් අමිල වයිජී
(ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය)



**දක්ෂතම සවි ඔසවන්නා**
සෙ/370469 සැරයන් ප්‍රදීප් එස්කේඑස්
(ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව)




"යුද්දෙ ඉවරවෙලා ඔයාගෙ අත්දෙක මේ තරම් ගොරෝසු වුණේ ඇයි සුපුන්?" රේණුකා සුපුන්ගේ අත්ල පිරිමදිමින් ඇසුවාය. "යුද්දෙ ඉවරවුනාට "පැටික්"ඉවර නැහැනේ රේණුකා"
"අනේ මංද, මං දන්න පැටික් එකක් නෑ. ඒක නෙවෙයි අම්ම කියනවා ඔයා හරි සෙල්ලක්කාරයිලු. පවුලක් වෙනවනම් ඔයිට වඩා වගකීමෙන් වැඩ කරන්න වෙයිලු" සුපුන්ගේ පපුතුරෙහි මුහුණ හොවාගනිමින් රේණුකා බොහෝ හැඟීම්බරව පැවසුවාය.
"ආමි කොල්ලො ඔහොම තමයි රේණුකා. ඇළිමැළි වෙලා හරියනවද? ඔයාගෙ අම්මට ඒක තේරෙන්නෙ නැහැ. හමුදාවෙ කොල්ලො හරියට වෙඩි වගෙ ඉන්න ඕනෙ. අපි එහෙම නොවුන නම් ප්‍රභාකරන් තාමත් ජීවතුන් අතර" සුපුන් දෙඅත් මිටිමොළවමින් මහත් උජාරුවෙන් පවසන්නට විය.
"එහෙම කියලා හරියනවද? විකාර කියවන්න එපා සුපුන්" රේණුකා හුන් තැනින් නැගිට්ටාය.
"නෑ නෑ රේණු, මම කියන්නෙ අපි ටිකක් ගැම්මට නොහිටියොත් විරුද්ධවාදීන් අපේ කරේ නගිනවා"
"විරුද්ධවාදීන්, යුද්දෙත් ඉවරවෙලා දැන් කොහෙද විරුද්ධවාදින්"
"ඔයාට මේවා කොහොම තේරුම් කරල දෙන්නද රේණු. කොටි ඉවර උනාට උන්ගේ හෙවණැලි හැමතැනම. ඒ විතරක්නම් බැරියැ දැන් වෙන වෙන විරුද්ධවාදීන් වැහිවැහැලා. ඔයාගේ අම්ම. උනත් අපේ සම්බන්දෙට මේ කරන්නේ හතුරුකම් නෙවෙයිද?"
"දෙමාපියෝ හැමවෙලේම බලන්නෙ දරුවන්ගේ යහපත. ඉක්මන් තීරණ අරගෙන අන්තිමට පසුතැවෙන්න වෙන්නෙ අපිටමයි" රේණුකාගේ හඬ වේගවත්ය. ඇයගේ වදන් හමුවේ සුපුන් තරමක් මෙල්ල වූ සෙයකි.
"හරි හරි පොඩ්ඩක් සන්සුන් වෙන්න රේණුකා. දැන් ඔයාගෙ අම්මා මට මොනවද කරන්න කියන්නේ" සුපුන් රේණුකාගේ දෙඅත් අල්ලා ගනිමින් ඇයගේ මුහුණට එබෙන අතරේ ඇසුවේය.
"මට කියන්න, ඔයා දැන් වැඩට යන්නෙ නැද්ද? වෙනදට මාස එකහමාරක් විතර සැරයක් මාව බලන්න එන කෙනා දැන් හැම සති අන්තෙම එන්නෙ කොහොමද? අම්මලාටත් තියෙන සැකේ ඒකයි. ඔයාම කියනවා ඉන්නේ ඕමන්තේ කියලා. ඒත් හැමදාම ගෙදර" රේණුකා ඉදිරියේ සුපුන් නිරුත්තර වූ ලෙසිනි.
"මම නම් පුදුම අවාසනාවන්තයෙක්. වෙන කෙල්ලෝ තමන්ගේ කොල්ලා ළඟට එනකල් ඇඟිලි ගණිනවා. ඉස්සර මම මාස ගණන් පරක්කු වෙනකොට ඔයාම කියනවා මට නිවාඩුදෙන නිලධාරීන්ට හිතක් පපුවක් නැද්ද කියලා. දැන් ඔයාට මම එන එකත් වදයක්. ඇත්තටම ඔයාට මාව එපාවෙලාද?"
"මෙතන තියෙන්නේ එහෙම ප්‍රශ්නයක් නෙවෙයි සුපුන්. ඇරත් අපි පොඩි ළමයි නෙවෙයිනෙ ජීවිතේ ගැන මීට වඩා වගකීමෙන් හිතන්න ඕනෙ"
"හමුදාවෙ රාජකාරී ගැන ඔයාට අවබෝධයක් නැහැ රේණු. ඔයාගෙ අම්මටත් එහෙමයි. මේ දවස්වල මම බුද්ධි රාජකාරී කරන්නේ. ඒ කියන්නේ සිවිල් පිට ඉඳන් තොරතුරු හොයනවා" සුපුන් මහත් උජාරුවෙන් කීවේය.
"බුද්ධි රාජකාරී, මම දන්න බුද්ධියක් නෑ. ඒත් ගෙදර ඉඳන් ඔහොම රාජකාරී කරන්න දෙනවද හමුදාවෙ. ඔයා ඕන දෙයක් කරගන්න. හැබැයි වියදමට කියලා ආයෙත් මගෙන් සල්ලි එහෙම ඉල්ලනව නෙවෙයි. මම යනවා මට පරක්කු උනා"
"රේණුකා පොඩ්ඩක් ඉන්න... මේ අහන්න" සුපුන්ගේ පැහැදිලි කිරීම අසන්නට තරම් රේණුකාට සිත් නොවීය. ඕ ඉක්මන් ගමනින් බසයට ගොඩ වූවාය.

"ආ සුපුන් ළමයා. පසුගිය ටිකේම මම දැක්කා හංදිය පැත්තෙ ඉන්නව. මොකෝ දැන් වැඩට යන්නෙ නැතෙයි" ඉස්කෝලෙ මහතා සුපුරුදු ලෙන්ගතුකමින් ඇසීය.
"නෑ නෑ ඉස්කොලේ මහත්තයා, මම මේ රාජකාරී වැඩකට ආපු ගමන් තාම නිවාඩු පිටමයි ඉන්නේ" සුපුන් එතරම් ගාණකට නොගෙන පැවසීය.
"ඒක මිසක් මම ඒත් බැලුවා අච්චර යුද්ද කාලෙත් වැඩට ගිය මනුස්සයා මේ දවස්වල මේ දවස්වල මොන එහෙකට නොගිහින් ඉන්නවද කියලා. හොඳා.. හොඳා.. එහෙනම් මම ගිහින් එන්නම්"

..................................................................

සිය ආදරවන්තිගේ නෝක්කාඩුවද ඉස්කොලේ මහතා කියූ වදන්ද ඔහුගේ දෙසවන් පුරා නැවත නැවත ඇසෙන්නාසේය. තමා වැන්නෙකු පිළිබඳව මෙතරම් ගමේ මිනිසුන් විපරමින් සිටීම පිළිබඳව සුපුන් තුළ වූයේ පුදුමයකි. තමාටත් වඩා තමා ගැන අන් අය සොයා බැලීම ඔහුට වදයක් විය. ඔහු තුළ හටගත් නොරිස්සුම් සහගත හැඟීම් බොහෝ වෙලාවක් යනතුරු පහව නොගියේය. කල්පනාබරිතව හුන් සුපුන් ඉදිරියට පියවර එසවූයේ අරමුණකින් තොරවය. යාබඳ පන්සල් බිමේ සාණ්ඨාර නද ඇසෙත්ම එදින පොහොය දිනයක් බව ඔහුට මතක් විය. එහෙත් පන්සල තුළට යාමේ සිතක් සුපුන් තුළ නැතත් ගේට්ටුව අභියසදීහම ලොකු හාමුදුරුවන්ගේ නෙත ගැටීම හේතුවෙන් ඔහුට පන්සල මඟහැර යෑමටද නොහැකිය.
"කාලෙකට පස්සේ සුපුන් ළමයා පන්සල් යනවා දැක්කේ. අම්ම නම් හැම පෝයකටම නොවරදවාම සිල් සමාදන් වෙනව. දායක සමිතියේ වැඩ වලටත් පණ ඇරල. ඔය ළමයගේ රාජකාරි වැඩත් එක්ක ඉතින් එහෙම කරන්න බැරි බව අපි දන්නවනෙ. ඒක නොවෙයි මම මේ සුපුන් ළමයගෙන් අහන්නමයි හිටියේ. ඔය ළමයා දැන් වැඩට යන්නේ නැතුවවත්ද? තාම පැන්ෂන් යන්න කාලෙකුත් නෑ මයෙ හිතේ."
ලොකු හාමුදුරුවන් කිසිවක් සැකහැර දැනගත යුතු නියාවෙන් ඒ ප්‍රශ්නය තමා වෙත යොමු කළ බවක් සුපුන්ට හැඟිණ.
"නෑ ලොකු හාමුදුරුවනේ මං මේ රාජකාරි වැඩකට කොළඹ ආපු ගමන් තාම ඉන්නේ"
"ආ ඒක කොච්චර හොඳද, ගෙදර ඉඳන් රාජකාරී කරන්න ලැබෙනව නම් මං මේ නිකමට ඇහුවෙ"
තමා කළ පැහැදිලි කිරීම ලොකු හාමුදුරුවන් කොතෙක් දුරට පිළිගත්තා දැයි සුපුන් නොදනී. කෙසේ වූවද තමා පිළිබඳ ලොකු

කෙටි කතාව

හාමුදුරුවන් කළ විමසීම ගැන ඔහු තුළ වූයේ නොකැමැත්තකි. ලොකු හාමුදුරුවන්ගෙන් සමුගත් සුපුන් පන්සල තුළට පියවර මැන්නද ඔහුගේ සිත බෙහෙවින් නොසන්සුන්ය. ඔබමොබ යනෙන බොහෝදෙනා අතරේ තමා දන්නා අඳුනන අයවලුන් හිඳීම පවා සුපුන්ට කරදරයක් විය.

"හලෝ සුපුන් උඹත් දැන් හැම පෝයටම ගෙදර නේද?"
පාසල් සිසුවකු වූ වසන්ත බෝ මලුව අසලදී සුපුන්ගේ උරහිසට තට්ටුවක් දමමින් ඇසුවේය.
"උඹලට පන්සල් ආවත් වැරදියි. අනික මාසෙකට පෝයවල් දෙක තුනක් නැහැනෙ. එහෙම දවසක ගෙදර එන එක මට අකැපද?"
සුපුන් තරමක් දැඩි ස්වරයෙන් පැවසීය.
"වැරදියට හිතන්න එපා මචං, මම නිකමට ඇහුවේ. හමුදාවට ගිය මුල් කාලෙ උඹව දකින එක හාව හඳ දකිනවා වගේනෙ. ඒත් දැන් උඹ නිතරම නිවාඩු එන හින්දා මම හිතුවා ගෙදරම කැම්ප් එකක් දාලද කියලා"
වසන්තගේ අවඥාසහගත වදන් සුපුන්ට නොරිස්සුවේය. හෙතෙම තවදුරටත් ඔහු සමීපයේ නොරැඳී ඉවත්විය.

යන යන තැන තමන් මාතෘකාවක් බවට පත්වී ඇති වගක් සුපුන්ට දැනිණ. කුමක් කළ යුතු දැයි සිතාගත නොහැකි තරමට ඔහුගේ සිත පැටලුණු නූල් බෝලයක් සේ ව්‍යාකූල වී ඇත. කල්පනාවක නිමග්නව ඔහු පාරට පැමිණියේය. නගරය දක්වා දිවෙන බස් රථයක් ඈතින් ඇදෙත්ම ඊට ඔහුගේ අත දැමුනේ නොදැනීමය. රියදුරු සේම කොන්දොස්තරද හොඳින් පුරුදු එම බස් රථයෙහි වැඩි සෙනඟක්ද නොවූ හෙයින් සුපුන් ඉදිරිපසට වන්නට සුවපහසු අසුනක වාඩිවිය.
"ආ... සුපුන් මල්ලී, කොහෙද මේ ජැන්ඩිපහට ඇඳල"
කොන්දොස්තරවරයා දෑස් ලොකුකර බලමින් ඇසුවේය.
"මම මේ හන්දියට යනවා නිමල් අයියෙ පොඩි වැඩකට" සුපුන් බස් ගාස්තුව ඔහු අත තබන අතරේ පැවසීය.
"ම්... ම්... පොඩි වැඩකට වෙන්න බෑ. පසුගිය සතියෙත් මම දැක්කා ටවුමේ ඉස්කෝලේ ළඟ කැරකෙනවා. අපිත් ඉතින් දවසට තුන් හතර වතාවක් දුවන්නෙ ඉස්කෝලේ ඉස්සරහින්නෙ. හහ්... කොන්දොස්තරවරයාගේ හිනහවට රියදුරුද එකතුවී ඇත. ඔවුන්ගේ එවදන් වලට යන්තම් සිනහවකින්ම සංග්‍රහ කළ සුපුන් ජනේලයෙන් ඉවත බලන්න වූයේ ඒ පිළිබඳව එතරම් තැකීමක් නොකරන බව පෙන්වන්නට මෙනි. මෙතරම් බස් රථ තිබියදීත් මෙම බස් රථයටම ගොඩවන්නට සිදුවීම ගැන සුපුන් පසු තැවුණේය.
"සුපුන් මල්ලී දැන් උඩහ නෙවෙයිද ඉන්නේ"
රියදුරු අසුනේ සිට නිශ්ශංක අයියාද සුක්කානම කරකවන අතරේ ඉදිරිය බලාගෙනම ඇසුවේය.
"ඔව් නිශ්ශංක අයියා තාම ඉන්නේ ඕමන්තේ. ඒත් මේ දවස්වල මම කොළඹ කෝස් එකක් කරනව"
සුපුන් බොහොම අමාරුවෙන් වචන ගළපා ගත්තේය.
"නෑ නෑ නිශ්ශංක අයියා සුපුන් මල්ලී කෝස් එක කරන්නේ ටවුමේ ඉස්කෝලේ ගේට්ටුව ළඟ
හහ්... හහ්... දකින හැමදාම එතන. ගිය මාසේ අපි බස් එක සර්විස් එකට යනකොටත් හිටියෙ මතක නැද්ද?"
බස් රථයේ මැද කොටසේ හුන් කොන්දොස්තරවරයා හඬනගා පවසන්නට වූයෙන් සුපුන් තුළ හටගත්තේ ලැජ්ජාවකි. තවදුරටත් ඔවුනගේ උසුලු විසුලු වලට ලක්වන්නට තරම් සුපුන්ට සිත් නොදේ. ඔහු හුනස්නයෙන් නැගිටිමින් ඉදිරිපස පා පුවරුව වෙත ළංවිය.
"නිශ්ශංක අයියා මාව ඉස්සරහ සමූපකාරය ගාවින් දාලා යන්න."
"ඇයි මල්ලි ටවුමට නේද යනවා කිව්වේ". බස් රථයේ වේගය අඩු කරන අතරේ රියදුරු නිශ්ශංක ඇසුවේය. ටවුන් එකට යන්නත් ඕනෙ නිශ්ශංක අයියා ඊට කලින් යාලුවෙක් ඉන්නවා පොඩ්ඩක් හම්බවෙලාම යනවා. රියදුරුට තවත් යමක් අසන්නට ඉඩ

> "යකෝ මේක හරි මගුලක්නේ මට මෙච්චර කලක් පඩි ගෙව්වේ ගමේ එවුන්ද, මම ගෙදර හිටියාම මුන්ටනේ රුදාව සුපුන් දත් මිටි කමින් තමාටම කියා ගත්තේය."

නොතබාම සුපුන් බස් රථයෙන් බිමට පැන්නේය.
පාර අද්දරටවත් සුපුන් නොපෙනී යන බස් රථය දෙස බලා සිටියේ දිග සුසුමක්ද පිට කරමිනි. දිගින් දිගටම සමාජයේ විවිධ අයවලුන්ගෙන් එල්ලවන විමසීම්, විවේචන තවදුරටත් ඔහුට දරාගත නොහැකි අයුරකි. හෙතෙම බොහෝ සෙයින් විඩාවට පත් වූ සෙයකි. "යකෝ මේක හරි මගුලක්නේ මට මෙච්චර කලක් පඩි ගෙව්වේ ගමේ එවුන්ද, මම ගෙදර හිටියාම මුන්ටනේ රුදාව" සුපුන් දත් මිටි කමින් තමාටම කියා ගත්තේය.
බොහෝ වේලාවක් කල්පනාවේ නිමග්නව සිටි ඔහුගේ ඉරියව්ව තුළ කිසියම් අරමුණකට එළඹ ඇති බවක් දිස්වූයේය. නගරයට යාම පසෙක ලූ සුපුන් ආපසු යන බස් රථයකට අත දැමීය.

..............................................................................................

සති දෙකක් ඉක්ම ගියද සුපුන්ගෙන් තොරතුරක් නොලැබීම රේණුකාට ප්‍රෙහේලිකාවක් වූවාය. ඈ තුළ තම පෙම්වතා පිළිබඳ හටගත්තේ අනුකම්පාවකි.
"පව් මම එදා කතා කළා සැර වැඩිද මන්දා".
ඇය සෙමින් මිමිණුවාය. කාමරයේ ජනේල් පියන විවර කළ රේණුකා ජනෙල් පොලු අතරින් ඈතට දිවෙන ගුරු පාර දෙස හිස් බැල්මක් හෙලුවාය.
"ට්‍රිං... ට්‍රිං... ට්‍රිං..."
බොහෝ කලක පටන් හුරුපුරුදු ඒ හඬ රේණුකා තුළ බලාපොරොත්තු දල්වීය. ඕ හනිකට මිදුලට දිව ගියාය.
"දෙයියනේ සුපුන්ගෙන් ලියුමක්". ඈ ඉස්පාසුවකින් තොරවම ලිපිය කියවන්නට වූවාය.

"ආදරණීය රේණු. මම එක දෙයක් තේරුම් ගත්තා. හමුදාවට බැඳිලා ඇබ්සන් වෙනවාට වඩා හොඳයි වහ ටිකක් කන එක. ඔයාගේ මල්ලිටත් හමුදාවට බැඳෙන්න ආසයි කිව්වලුනෙ. මිනිහට කියන්න අතරමගදී නවතින්න බලාගෙන නම් හමුදාවට බැඳෙන්න එපා කියලා. කොහොම හරි අවුරුදු 22 ක් ඉඳලා නීත්‍යානුකූලවම විශ්‍රාම යන්න කියන්න. එහෙමත් නැත්නම් හමුදාවට බැඳෙන්නෙම නැතුව ඉන්න කියන්න හිතුමනාපේ ඇබ්සන්ට් වෙලා නිකන් චාටර් වෙන්න එපා කියන්න. මම ආයි වැඩට ආපු බව ඔයාගේ මහලොකු අම්මටත් කියන්න. තවත් කියන්න ඕනවුන් රොත්තක් ගමේ ඉන්නවා. මේ පාර ආවාම මම අර බස් කොන්දටයි, ඩ්‍රයිවරයටයි, ඉස්කෝලෙයටයි හැමෝටම පෙන්නනවා මම තාමත් හමුදාවේ කියලා. මම ආයිත් වැඩට ආපු බව ඔයාට තවත් විශ්වාසයක් නැත්නම් ඊළඟ නිවාඩුවෙදි මගේ ලිව් චිට් එකයි, පේ ෂීට් එකයි, ඩියුටි කොලේකුයි තුනම ඔයාට ගෙනත් පෙන්වන්නම්. අන්න එතකොට ඔයා පිළිගනී ඔයාගේ සුපුන් අබ්සන්ට් නැති බව".

ලිපියේ අවසන් වැකි කිහිපය ගළපා ගන්නට නොහැකි තරමට රේණුකාගේ දෙඇස් බොඳවී තිබුණි. දෙකම්මුලින් රූරා වැටී කඳුලු බිඳු දෙකක්, ටොක් හඬින් ලිපිය මත වැටුණේ ඇයටත් නොදැනීමය ඕ ලිපිය එක අතකට ගුලිකර ගෙන උතුරා යන සතුටින් යුතුව කුස්සිය වෙත දිවගියේ අසල මේසය මත තිබූ මල්වාසයද පෙරලා ගනිමිනි.

අම්මා, අම්මා, සුපුන් වැඩට ගිහින්...

නිමි.

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ





# කායික හා මානසික වර්ධනයට යෝගා වැඩමුළුවක්

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී ගේ සංකල්පයකට අනුව, ආරක්ෂක සේනා මධ්‍යම ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ගේ උපදෙස් හා මගපෙන්වීම මත සංවිධානය කෙරුණු යෝගා වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් මස 26 සිට ඔක්තෝම්බර් 06 දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයට අයත් ටෝච් සිනමා ශාලාවේදී පවත්වන ලදී.

ප්‍රධාන උපදේශිකා ප්‍රවීණ රංගන ශිල්පිණී අනෝජා වීරසිංහ මහත්මිය විසින් මෙහෙයවන ලද මෙම වැඩසටහනට ආරක්ෂක සේනා මූලස්ථාන යටතේ පාලනය වන ඒකක හා පුහුණු පාසල්හි රාජකාරී නියුතු නිලධාරීන් 06 දෙනෙකු සහ සෙබලු 68 දෙනෙකු සහභාගී වූහ. යුද්ධ හමුදා සෙබළ සෙබළියන් තුළ ශාරීරික හා මානසික නිරෝගීතාවය පවත්වා ගැනීමත්, යහපත් සමාජයක් බිහිකිරීමත් මෙහි ප්‍රධාන අරමුණ විය.

# "පිරිසිදු වෙරළක් ලස්සන රටක්"

ඉකුත් ඔක්තෝම්බර් 10 දිනට යෙදුණු 70 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව 681 බළසේනාවේ මූලිකත්වයෙන් "පිරිසිදු වෙරළක් ලස්සන රටක්" යන තේමාව යටතේ මුල්ලිවෙක්කාල් සිට චලෙයි දක්වා කිලෝමීටර් 19.5 ක වෙරළ තීරය පිරිසිදු කරන ලදී. නොදිරන අපද්‍රව්‍ය හේතුවෙන් අපවිත්‍රව පැවති එම වෙරළ තීරය පිරිසිදු කිරීම සඳහා 68 සේනාංකයේ සේනාංකාධිපති, 681, 683 බළසේනාවන්හි බළසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීවරු ඇතුලු නිලධාරීන් හා සෙසුනිලයින් 250 ක් පමණ සහභාගී වූහ. එමෙන්ම මෙම ප්‍රජාසත්කාරය සඳහා ප්‍රදේශයේ සිවිල් ජනතාව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නිලධාරියෙකු හා ප්‍රදේශයේ ග්‍රාමසේවා වසම්හි ග්‍රාමසේවා නිලධාරීන්ද සහභාගී වන ලදී.




# රණවිරුවන්ගෙන් හිසට සෙවණක්



ආරක්ෂක සේනා මූලස්ථානය වන්නි ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ වන්නි බළප්‍රදේශයේ සිටින අඩු ආදායම්ලාභී පවුල් වෙත, දෙස් විදෙස් දානපතීන් සමග සම්බන්ධ කරගනිමින් සිදුකරනු ලබන නිවාස ඉදිකිරීමේ වැඩසටහනෙහි තවත් පියවරකට ඉකුත් ඔක්තෝම්බර් 05 දින ඇලයාපත්තුව ප්‍රදේශයේදී මුල්ගල තබන ලදී.

මෙම නිවස ලබාගැනීමට හිමිකම් ලබාගෙන ඇත්තේ 21 බළසේනාංක ප්‍රදේශයට අයත් වන්නිහැළඹවැව, ඇලයාපත්තුව, අනුරාධපුර ලිපිනයේ පදිංචිව සිටින දරුවන් 05 දෙනෙකුගෙන් යුත් කේබී අසංක ප්‍රදීප් බංඩාර මහතාගේ පවුලය. මෙම නිවස ඉදිකිරීමට මූල්‍ය දායකත්වය සපයනු ලැබුවේ ඕස්ට්‍රේලියානු ජාතිකයන් වන ඒඩී රොබින්සන් සහ ගෙයිල් රොබින්සන් යන මහත්ම මහත්මීන් විසිනි. නිවස ඉදිකිරීම සඳහා යුද්ධ හමුදාවේ ශ්‍රම දායකත්වය ලබාදීමට නියමිතව ඇති අතර, නිවසට ජලය ලබාගැනීම සඳහා රුපියල් ලක්ෂයක පමණ වටිනාකමකින් යුත් නල ළිඳක්ද රුපියල් පනස්දාහකට අධික ගෘහභාණ්ඩද ලබාදීමට නියමිතව ඇත.

එම නිවස ඉදිකරීමේ අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් 212 බළසේනාධිපති කර්නල් පීඒඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී එක්වූ අතර ඒ සඳහා නිලධාරීන් හා සෙසුනිලයින් මෙන්ම ගම්වාසී විශාල පිරිසක් ද සහභාගි වූහ.

## 63 වසරක අභිමන් සැමරුම





අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන 2(සෙච්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 63 වන සංවත්සරය, අණදෙන නිලධාරී මේජර් ඒඑම්ඩබ්ලිව්පී අබේසේකර ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ඔක්තෝම්බර් 02 දින මහනුවර පිහිටි ඒකක මූලස්ථානයේදී සමරන ලදී. එහිදී අණදෙන නිලධාරී වෙත සම්මාන පෙළපාලියකින් බුහුමන් පුදනු ලැබූ අතර, මාස දෙකක් වැනි කෙටි කාලයක් තුළ ඒකක සියලු නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකළ කොනොනි සමාජ ශාලාව කොනොනීන් හට පවරාදීමද එදින අණදෙන නිලධාරී අතින් සිදුවිය. තවද, සියලු නිල තේපැන් සංග්‍රහයක් හා සියලු නිල දිවාභෝජන සංග්‍රහයක්ද පැවැත්වූ අතර, ඒකකයේ රාජකාරී කර රට දැය වෙනුවෙන් දිවි පිදූ සියලුම නිලධාරීන් හා සෙසුනිලයින් සිහිකිරීමත්, රාජකාරියේ නියුතු සැමට ආශිර්වාද කිරීමත් වෙනුවෙන් පැවැත්වූ ආගමික වාතාවත්ද එම වැඩසටහන් අතර ප්‍රධාන තැනක් ගන්නා ලදී.

## පුලතිසි මේලා සංගීත ප්‍රසංගය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සුබසාධනය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන නිවාඩු බංගලා නවීකරණය කිරීම සඳහා අවැසි ආධාර මුදල් ලබාගැනීම වෙනුවෙන් පුලතිසි මේලා සංගීත ප්‍රසංගය ඉකුත් ඔක්තෝම්බර් 05 දින හිගුරක්ගොඩ ඩඩ්ලි සේනානායක ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ බලකාධිපති බ්‍රිගේඩියර් බීපී කල්දේරා ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම ප්‍රසංගය සඳහා දිවයිනේ ජනප්‍රිය ගායක ගායිකාවන් රැසක් සහභාගී වූහ.






## වසර 33 ක ගමන්මඟ සමරයි...





ඒකාබද්ධ පුහුණු ආයතයේ අභිමානවත් 33 වන සංවත්සරය පසුගිය ඔක්තෝම්බර් 06 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් ඉකුත් ඔක්තෝම්බර් 07 සහ 08 යන දෙදින තුළ එම පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් උත්සව මාලාවක් පවත්වන ලදී. එහිදී සේනාවිධායක වෙත කඳවුරු සම්මාන මුරයක් සහ සම්මාන ආචාර පෙළපාලියක් පිරිනැමීම, සියලු නිල රාත්‍රී භෝජන සංග්‍රහයක් පැවැත්වීම සහ ආගමික වතාවත් මෙම වැඩසටහන්වලට අයත් විය. තවද ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය වෙනුවෙන් නිර්මාණය වූ තේමා ගීතය ප්‍රථම වරට එළිදැක්වීමද සංවත්සර දිනයේ කැපීපෙනුණු අංගයක් විය.






# සුබ මොහොතින් නව තනතුරක

ගැමුණු හේවා බලකායේ 15 වන රෙජිමේන්තු අධිපති වශයෙන් මේජර් ජෙනරාල් ටීඑස් බන්සජායා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්සී යූඑස්පී එන්ඩීයූ ඉකුත් ඔක්තෝම්බර් මස 26 දිනට යෙදුණු සුබ මොහොතින් සිය තනතුරෙහි රාජකාරී භාරගන්නා ලදී. ඒ නිමිත්තෙන් එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සංවිධානය කෙරුණු අභිමානවත් උත්සවයේ මතක සැමරුම් මෙහි දැක්වේ.

## 69 වසරක අභිමානය සමරා





1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ 69 වන සංවත්සරය ඉකුත් අගෝස්තු 01 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් සංවිධානය කෙරුණු වැඩසටහන් අතර, පනාගොඩ පිහිටි යුද්ධ හමුදා බෝධිරාජාරාමයේදී බෝධිපූජා පිංකමක් පැවැත්වීම, කොරතොට බියුප්‍රඩ් පෙරේරා වැඩිහිටි නිවාසයට දානය පිළිගැන්වීම, ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීම, අණදෙන නිලධාරී වෙත කදවුරු සම්මාන මුරයක් සහ සම්මාන ආචාර පෙළපාලියක් පැවැත්වීම විශේෂ විය.

## රණවිරුවන් හට සෙත්පතා කෝවිල් පූජාවක්





64 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්සීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී ගේ මූලිකත්වයෙන් ඉකුත් සැප්තැම්බර් මස 24 දින ඔඩ්ඩුසුඩාන් ශිවම් කෝවිල් පරිශ්‍රයේදී විශේෂ දේව පූජාවක් පවත්වන ලදී. ක්‍රියාන්විතයන්හිදී මියගිය සහ ආබාධිත තත්ත්වයට පත් වීරෝදාර රණවිරුවන් හට සෙත්පතා පැවති එම පූජාව 70 වන යුද්ධ හමුදා සංවත්සරය නිමිත්තෙන් සංවිධානය කරන ලද්දකි. මෙම අවස්ථාව සඳහා එම සේනාංකයට අයත් බළසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීන් ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගි වූහ.

# මාතර, මාතරයෝ සහ මාතර අහස යට සිට...



අපි බොහෝ දෙනෙකු ගම ගැන කතා කරන්නේ මහත් ආඩම්බරයකිනි. මාතර අපිද, ගම මාතර වීම ගැන නොයෙක් පුරසාරම් දොඩති. පිටරටකදී පමණක් නොව ලංකාව තුළදීම වෙනත් පෙදෙසකදී හෝ රැකියා ස්ථානයකදී මාතර මිනිසෙකු මුණගැසුණු විට හිතට දැනෙන හෘදයාංගම බව දන්නේ තවත් මාතරයෙක්ම පමණි. බොහෝ විට මේ හෘදයාංගම බවට නිලතල, වයස, තරාතිරම, කුලමල හෝ ස්ත්‍රී පුරුෂ භාවය ආදිය කිසිසේත්ම බලපාන්නේද නැත. විශේෂයෙන්ම මාතර ගම කරගත් අපටම උරුම සිරිත් විරිත්, විලාසිතා, ජීවන රටා මෙන්ම ආවේණික වාග්විලාෂයක්ද ඇති අතර, ඇතැමුන්ට මේවා විහිළු සහගත හෝ අසාමාන්‍ය දේ ලෙසත් පෙනිය හැක.

බොහෝ දෙනෙකු මුදවාපු කිරි අතුරුපසක් ලෙස ගන්නා විට කුඩා කප් එකකට දමා ගෙන කෑවද මාතර අය කිරි කන්නේ පිගන් වලය. මාතර පැරැන්නන් බත්, මාළු, එළවළු සමග මිශ්‍රව කිරි කන අතර වත්මන් පරම්පරාව තුළද එම පුරුද්ද නැත. ලංකාවේ බොහෝ මිනිසුන් උත්සව අවස්ථාවන් හිදී පැණි බෝතල්වල ගබඩා කරගත්තද මාතර නිවෙස්වල පැණි බෝතල් වෙනුවට ඇත්තේ පැණි මුල්ය. මාතර නගර සීමාවෙන් එපිට පිහිටි ගම්වල ගැමි තරුණයෝ සිය පෙම්වතියන් බැහැදැකීමට යාමේදී කිරි මුට්ටියක් හා පැණි මුලක් රැගෙන යාම තවමත් සුලභය. තුන් වේලටම බත් කන මාතර මිනිස්සු පොල්, බලමාළු සමග කැකුළු බත් කෑමට රුසියෝ වෙති. කැකුළු බත් සමඟ පැණි සහ පොල් එකට දමා අතුරුපසක් ලෙස ගැනීමද මාතරටම ආවේණික කෑමකි.

"ඔයා" හෝ "එයා" යන්න මාතරයන් උච්චාරණය කරන්නේ "ඔහේ" සහ "එයැයි" ලෙසිනි. කෑවද, බීවද මාතර මිනිසුන්ට අනුව කෑවයි, බිව්වයි වේ. එතරම් හැඩ වැඩක් නැති කාන්තාවක් හැඳින්වීමට මාතර වැඩිහිටි කතුන් යොදා ගන්නේ "ඒකි එතරම් පාටක් නම් නෑ" කියාය. ටිකක් විසේ ගතිය ඇති තරුණ කතක් මාතර වැඩිහිටියන්ට අනුව එක විදියක බඩ්ඩකි. "ඒකි ඉගෙනගෙන නම් තමයි හැබැයි, ටිකක් එක විදියක්" කියා මගේ මව වරක් පැවසුවේ අපේ ළඟම ඥාතියෙකු විවාහ කරගත් පිටගම්කාරියක් සම්බන්ධයෙනි. මම තරුණ ලුතිනන් වරයෙකුව සිටියදී මනාලියන් කිහිපදෙනෙකු බලන්න ගියද මගේ අම්මාට එම මනාලියන් එකවිදියකට පෙනුණු නිසා සුන්දර මනාලියන් කිහිපදෙනෙකුගේ අත ගැනීම ඉතා ඛේදජනක ලෙස මට මග හැරුණි.

මාතර මිනිසුන් ආගන්තුක සත්කාරයට ලැදිය. යම් අකරතැබ්බයකට මුහුණදුන් අයෙකු වෙනුවෙන් සිය කාලය, ධනය, ශ්‍රමය ලෝභ නැතුව කැප කිරීමට මාතර මිනිසුන් පැකිලෙන්නේ නැත. මෙසේ ඉවක් බවක් නැතිව අනුනට උදව් කිරීමට ගොස් අමාරුවේ වැටුණු මාතර මිනිසුන් මා අනන්තවත් දැක ඇත. කරුණු එසේ වුවද ඉතා සිල්ලර දේකට පවා පවුලේ අයවලුන් සමග මෙන්ම සිය අසල්වාසීන් සමගද නොහොඳ නෝක්කාඩු වී පැටලෙන මාතර මිනිසුන් කිසියම් විපතකදී සියල්ල අමතක කර එකිනෙකාට උදව් පදව් කරන්නටද කිසි විටෙක පැකිලෙන්නේ නැත. මම දන්නා තරමට බොහෝ මාතර මිනිසුන් සිය අල්ලපු ගෙදර සමග කිසියම් හේතුවක් අරඹයා උරණව සිටිති. තත්ත්වය එසේ වුවද අන් අයෙකුගේ විපතේදී බොහෝ මාතර මිනිසුන්ගේ නෙත් වලට කඳුලු නැගෙන බව නම් සැබෑය.

දිවයිනේ අන් ප්‍රදේශයන්ට සාපේක්ෂව බලිතොවිල්, යාගහෝම හා ගුරුකම් සඳහාද මාතර ප්‍රසිද්ධය. අනවින කොඩිවින හා වශී ගුරුකම් සඳහා මාතර යකැදුරන්ගේ පිහිට පතා එන පිටගම් කාරයින් අනන්තය. මාතර යකැදුරන් යකුන් බැඳ වැඩ ගත් අයුරු දකුණේ පැරණි ජන කතාවලද දක්වේ. මෙහි සත්‍ය අසත්‍යතාවය කෙසේ වෙතත් බොහෝ මාතර මිනිසුන් ඕනෑම යකෙකුගෙන් වැඩ ගැනීමේ කලාව නම් මොනවට ප්‍රගුණ කර ඇත. යකුන් බැඳගෙන වැඩ ගැනීමේ මාතර මිනිසුන්ගේ පැරණි හැකියාව ගැන වරක් කිසියම් සංසදයකදී **(Forum)** කයිවාරුවක් ගැසූ මට පිට පළාතක මිත්‍රයෙක් උපහාසයෙන් මෙන් පැවසුවේ මාතර ගැහැනුන් බොහෝ විට යක්ෂයින් මෙන් හැසිරෙන නිසා මෙවැනි ජනප්‍රවාදයක් ඇති වී ඇති බවයි. ඕනෑම වාග් ප්‍රහාරයකට ක්ෂණිකවම කැපෙන ප්‍රතිචාරයක් දක්වන මම එම අවස්ථාවේ නම් ඔහුට නිසි ප්‍රතිචාරයක් දැක්වීමට බැරිව මොහොතක් අන්ද මන්ද වුනෙමි.

> **"ඔයා" හෝ "එයා" යන්න මාතරයන් උච්චාරණය කරන්නේ "ඔහේ" සහ "එයැයි" ලෙසිනි. "කෑවද", "බීවද" මාතර මිනිසුන්ට අනුව "කෑවයි", "බිව්වයි" වේ. එතරම් හැඩ වැඩක් නැති කාන්තාවක් හැඳින්වීමට මාතර වැඩිහිටි කතුන් යොදා ගන්නේ "ඒකි එතරම් පාටක් නම් නෑ" කියාය. ටිකක් විසේ ගතිය ඇති තරුණ කතක් මාතර වැඩිහිටියන්ට අනුව "එක විදියක බඩ්ඩකි".**

මාතර නගරය මැදින් ගලා යන නිල්වලා නදිය, මුහුදු විහාරය (පැරණි පරවි දූව), මාතර තානායම, මහානාම පාලම, කොටු පවුර, තාරකා කොටුව, මාතර බෝධිය, ක්‍රිස්තියානි පල්ලිය හා මුස්ලිම් දේවස්ථානය තවමත් මාතර නගරය තුළ දැකිය හැකිය. බක්කි කරත්ත මාතර නගරයට එක් කරන්නේ මනබඳිනා අලංකාරයකි. බොහෝ මාතර මිනිසුන් මාතර සිය දෙවනි මව සේ සලකන අතර, ගමෙන් බැහැරව පිට පළාත්වල රාජකාරි කරන මාතරයන් එම පිට පළාත්වල සිට මාතර බලා දිවෙන බසයක් දැකීමේදී පවා සංවේදී වන බව මම අත්දැකීමෙන් දනිමි. ලෝකයේ කොයි අස්සක මුල්ලක, කොයි තරාතිරමක හෝ කුමන සමාජයක ජීවත් වුනද, මාතර අහස යට ඉපදුනු අපි මාතර පොළොව යටම වැළලෙන්නටද කැමති බව කිසිදු විවාදයක් නැත.

*බ්‍රිගේඩියර් කීර්ති කෝට්ටවත්ත*
*නියෝජ්‍ය සේනාවිධායක, යුද්ධ හමුදා විද්‍යාපීඨය, දියතලාව*





# සුහදත්වය වර්ධනයට සුහද හමුවක්

පුනරුත්තාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරී කරනු ලබන නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සුහදත්වය වර්ධනය කරලීම උදෙසා වාර්ෂිකව පවත්වන ලද සුහද හමුව ඉකුත් සැප්තැම්බර් 28 දින ලයාලෙෂර් කුකුලේගඟ හිදී පුනරුත්තාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඩබ්ලිව්එස් රාජකරුණා යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

# "යුද සාහිත්‍යය" දේශනයක්





සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවති නිලධාරී පුහුණු දින දේශනයේදී

**"යුද්ධය අවසන්ව මේ වනවිට දස වසක් ඉක්ම ගොස් ඇතත් අප රට තුළ තවමත් යුද සාහිත්‍යයක් බිහිවී නොමැත. තිස් වසරක් පුරා මෙරට පැවති යුද්ධයට සක්‍රියව දායකත්වය දැක්වූ බොහෝ දෙනෙකු ගෙවී ගිය දශකය තුළ සේවයෙන් ඉවත්ව හෝ විශ්‍රාම ගොස් ඇත. ඉදිරි කාලපරිච්ඡේදය තුළදිද තවදුරටත් එවැනි පිරිස් හමුදාවෙන් ඉවත් වීමට නියමිතය. ඒ අනුව අනාගතයේදී කිසිදු යුද අත්දැකීමක් නොමැති පිරිසක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ බිහිවනු ඇත.**

**ඕනෑම රටක හමුදාවක ඇති විය හැකි සාමාන්‍ය තත්ත්වය එය වුවද යුද අත්දැකීම් යනු කෙනෙකු විශ්‍රාමය සමඟ රැගෙන යායුතු දෙයක් නොවන්නේය. එය ඉදිරි රණවිරු පරපුර උදෙසා බෙදාදිය යුතු දෙයකි. අනාගත හමුදාවක අභිමානය රඳා පවතිනුයේ එකී අත්දැකීම් මතින් ලබන පන්නරය තුළිනි. එබැවින් තමන් සතු යුද බිමේ මතක ලේඛන ගත කිරීමත් එකී අත්දැකීම් පිළිබඳ අලුත් රණවිරු පරපුර දැනුවත් කිරීමත් එම අත්දැකීම් සහිත සෑම තරාතිරමකම හමුදා සාමාජිකයින් සතු වගකීමකි"**



කලාඩය වෘත්තීය පුහුණු පාසලේදී විශ්‍රාම ලබන ජ්‍යෙෂ්ඨ නොනීන් සඳහා මෙන්ම ආධුනික සෙබලුන් සඳහා පැවති දේශනයේදී

ඉහත අරමුණ පෙදැරිව යුද්ධ හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂක මණ්ඩලයේ මෙහෙයවීමෙන් එහි අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ආර්එම්පීජේ රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් මත යුද්ධ හමුදා අංශ, ආයතන තුළ මෙන්ම පාසල් ඇතුලු සිවිල් සමාජය අතර, "යුද සාහිත්‍යය" ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් අරඹා ඇත. අදාළ දේශන පිළිබඳව බොහෝ අංශ වෙතින් මේවනවිටත් විශාල ඉල්ලුමක් හා ඇගයුමක් ලැබෙමින් පවතී. මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ යන නිලධාරී විසින් එම දේශන මෙහෙයවන අතර, තත් නිලධාරී යුද අත්දැකීම් ඇසුරෙන් පොත්පත් රැසක් රචනා කොට ඇති එම විෂය පිළිබඳ අත්දැකීම් සපිරි අයෙකි. එසේම ඔහු "රණවිරුවා" සඟරාවේ ප්‍රධාන සංස්කාරක ලෙසද කටයුතු කරයි.



573 බළසේනාවේ මෙහෙයවීමෙන් 1 ගජබා රෙජිමේන්තු මූලස්ථානයේ පැවති දේශනයේදී

# සිතුවිලි සාගරය

## සරසවි සඳ

සෙංකඩගල පුර ඒ වන පියසේ
දුටු මන පිනවන ඒ සඳ දුටුවේ
සඳවත එළියෙන් පිබිදුනි හදමල
දෙනෙත් කතාකළ සරසවි උයනේ

සෙනෙහස් කැල්මෙන් සඳදිය උතුරා
ඒ සඳ නොදනිති හද පෑ සෙනෙහේ
ඒතෙරට වැඩිකළ සඳරැස් වියැකී
අමාවකයි මගෙ හදවත් අරණේ

ඈගෙ හද රවටා හිරු තෙද පතුරා
සෙනෙහස් කැල්මෙන් සඳමිණි අතුරා
ඔහු ආ දිනයේ මගෙ සඳ රවටා
මගේ විජිතයෙන් ගිලිහී ගියදා

මගෙ සඳ අන්සතු ඉරකගෙ සඳු වී
සරසවි පියසේ සෙනෙහෙ විමානේ
හිරු සඳු එක්වී සෙනෙහස් මැදුරේ
ඔබ ඉනු මැන ඒ තෙද හිරු සෙවණේ

*කපිතාන් එච්එන්එන් පෙරේරා*
*යුධපති ආරක්ෂක ඒකකය*

## තාත්තා

ආසයි පියාණෙනි පිදුමට පෙම එක ලෙසට
තුරුලට එන්න ආසයි ලොව පෙනෙන්නට
කන්නට ඔබේ දෑතින් බත් කටවල් රසට
කොහෙදෝ පිනක් කවදා මේ පවුකාරියට

සෙනෙහස ගසක්ලු ඔබේ මහ රූසෙට වැඩුණු
හදවත ගලක්ලු දරුපෙම සඟවාගෙන උන්නු
දෑතට සවියලු දරුවගෙ දියුණුව දකිනු
ඒ සැමදේම මා හට අද හීනයක් වුණු

ගන්නට නුඹේ අත අවියක් කරලා
යන්නට දුරක් දිවියේ පියමං කරලා
දියුණුව ලබා නුඹ ලෝකේ රජ කරලා
ආසයි පියාණෙනි නුඹ සතුටුම කරලා

එනමුත් පමාවී ඇත අද නුඹගේ පොඩි දෝණී
නුඹ ගොස් අප දමා දිවියෙන් නැත පේනී
දස වසරකුත් ගතවී අප දා නුඹ ගියෙනි
කවුදෝ රජ කරන්නේ අද මගෙ ලොවෙහි

ගෞරව ලබා දෙන්නම් මගෙ පියාණෙනි
නුඹ දුන් ගුණ දහම් රැකගන්නම් පියාණෙනි
නුඹ පෙන්වූ මගෙහි යන්නම් පියාණෙනි
මතු භවේ මගෙ වේවා නුඹ පියාණෙනි

*සෙ/2088815*
*ආසෙ බංඩාර ඩීඩීඩීඑස්ඩී*
*20 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව*
*යුහ කඳවුර - පෙරියවලයන්කඩ්ඩු*

## ජීවිතය

ජීවිතය කෙසේ නම්
අරුත් ගැන්විය හැකිද?
විටෙක සුන්දරව ගලායන
තවත් විටක කලකිරී එපාවෙන
නොමැති නම් ඔහේ ගෙවීයන
කාලයම නොමවේද?
අප එකිනෙකා
අප අවට සිටින උන්හා
ගැටෙමින් හැපෙමින්
අප තුළ ඇතිකර ගන්න
සිතුවිලිවලින් පණ ගැහී
අප විසින්ම
සුන්දර හෝ අසුන්දර කරගන්නා
කාලයම
ජීවිතය නොවේද?

*මේජර් කේඑන්එස් මෙන්ඩිස්*
*නීති නිලධාරී - ආරක්ෂක අමාත්‍යංශය*

## සුදු දුවේ

කලාතුරකින් ඔයා දකින්නේ
පෝයදා පුන් සඳ වාගේ
මාතොටේ කඳවුරේ සිට
සිහිකරනෙමි මගෙ සුදු දුවේ...

තිස් වසරක ශාපලත් යුද්ධය
නිමා වුනත් ඔයා ලඟින් ඉන්නට නෑ
අප්පච්චිට මගෙ සුදු දුවේ...

දින තිහක් ගතවන තුර ෑ කඳවුරේ
නෑ ඉවසිල්ලක් දකිනතුරු
ඔය සුදු මුහුණ ඔබේ
බෝල බෝල මල් ගවුම
සොඳුරු සිරියෙන් ඔයා නැලවුණු හැටි
මගෙ සුදු දුවේ...

සිංදු කිය කියා අප්පච්චී ලඟ
දැවටුන හැටි සිහිකරමි මම
තල් වැටේ මායිමේ බංකරේ සිට
මගෙ සුදු දුවේ...

*සෙ/2ඩී01182*
*ලා/කෝ විමලසිරි එස්එස්*
*2(සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බළකාය*
*543 බළසේනා මූලස්ථානය*
*යුහ කඳවුර - මන්නාරම*

## සතුට

නෙළුම් කොළ කැකුලු විල සිනාවෙන් සැරසිලා
සොඳුරු බිඟු තුඩු වැදී උණුහුමට ගුලි වෙලා
සංසාරෙ පුරුදු ලෙස දෙසිත් එක්තැන් වෙලා
ගිම් නොවූ දිවි ගඟේ තුටු කඳුලු විසිරිලා

කඳුයාය මැද සොඳුරු නිම්නයක නැවතිලා
සිසිල් මිහිදුම් සළුවෙ සුමුදු ලෙස දැවටිලා
පහත් මිටියාවතේ නිල් ගොයම සනසලා
අපුරුයි නුඹ ඇවිත් සිනා කැන් බෝකලා

*කපිතාන් දිල්හාරා දිසානායක - ජාශිබ*
*හමුදා ලේකම් කාර්යාලය - යුහමු*

## මිතුරු මිතුදම

ගිම්හාන කාලයක
අහම්බෙන් වැටෙන
හිම කැටයකට වඩා
අපූරුයි අපේ මිතුදම...
පාසල් කාලයේ සිට
එකට දුව පැන
සෙල්ලම් කළ හැටි
තාම මතකය මගේ හද තුළ...
ඔබේ ජීවිත ගමන ගැන නුඹ
සිතා දුරගිය දා ඉඳන්
අපේ මිතුදම දුරස් දුරස් වී ගියා
අපේ මිතුදම සදා පවතී
සිතනු ඇත මා සදා...

*සෙ/ඊ00739*
*රසෙ ප්‍රේමචන්ද්‍ර ඩීඩබ්ලිව්*
*3(සේවා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව*
*යුද්ධ හමුදා කඳවුර, නුවරඑළිය*

## වියපත් ආදරය

ගත වැහැරුනත් සිත
තාම තරුණයි
සුදු හාමිනේ...
ආදර වදන් කොමල බව
ගිලිහුනත් මා වෙතින්
පෙරසේම ලෙන්ගතුයි
මං තාම
සුදු හාමිනේ...
දරුවන්ට දරුවො ගැන
බලන්නට වෙලානැති කළ
අපි අපි ගැනම බලාගමු
සුදු හාමිනේ...
පන්සලේ ගංටාර හඬ
ඇසෙන මානයට
සුදු මල් වට්ටියක් අරන්
හැමදාම පන්සල් යමු
හැරම්ටිය වාරුවෙන්
සුදු හාමිනේ...

*මේජර් කේකේවීඑස් කුමාර - ශ්‍රීලංජාආබමු*
*මාති 11 (මව්මෙ අංශය)*
*ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි)*





# යාන්ත්‍රික පාබල රණවිරු උදානය - 2019

වසරක් පාසා පවත්වනු ලබන යාන්ත්‍රික පාබල රණවිරු උදානය - 2019 සංගීත ප්‍රසංගය සහ වෙළඳ සැණකෙළිය 10 වන වරටත් ඉකුත් අගෝස්තු 30, 31 සහ සැප්තැම්බර් මස 01 යන දිනයන් හිදී දඹුල්ල ගම්උඩා ක්‍රීඩාංගනයේදී පවත්වනු ලැබීය. දිවයිනේ ජනප්‍රිය සංගීත කණ්ඩායම් සහ නර්තන කණ්ඩායම් සමගින් ජනප්‍රිය ගායක ගායිකාවන් රැසකගේ සහභාගීත්වයෙන් වර්ණවත් වූ මෙම සංගීත ප්‍රසංගය, යාන්ත්‍රික පාබල සන්නද්ධ රථ ප්‍රදර්ශනය, විනෝද ක්‍රීඩා හා ත්‍රාසජනක අංගයන්ගෙන් සමන්විත විය.

මෙම සංගීත ප්‍රසංගය සහ වෙළඳ සැණකෙළියේ අරමුණ වනුයේ යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවට අයත් මියගිය රණවිරුවන්ගේ පවුල්වල හා රණඝිතයට පත් රණවිරුවන්ගේ සුබසාධන කටයුතු ඉහළ නැංවීමත් රෙජිමේන්තුවේ ඉදිරි අභිවෘද්ධිය වෙනුවෙන් අරමුදල් රැස්කිරීමත්ය. යාන්ත්‍රික පාබල රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒඑම්එස්බී අතපත්තු හා යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිණී ෆෙඩ්රික් අතපත්තු මහත්මිය ගේ උපදෙස් හා මගපෙන්වීම මත මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් එස්ජේ ප්‍රියදර්ශන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඇතුලු සියලු නිලයින්ගේ සාමූහික එකමුතුවෙන් මෙම ප්‍රසංගය පැවැත්විණ.

# ජාතික ශිෂ්‍යභට බළකා කෙඩෙට් නිලධාරින් විසිර යති





ඉකුත් ජූලි 27 දින සිට සැප්තැම්බර් 08 දින දක්වා පැවැත්වූ ජාතික ශිෂ්‍යභට බළකා කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 40 දියතලාව ස්වේච්ඡා බළසේනා පුහුණු පාසලේදී පසුගිය සැප්තැම්බර් 08 දින විසිරයන ලදී. බ්‍රිගේඩියර් ඒඑස්පී පොඩිරාලහාමි යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති එම විසිරයාමේ අවස්ථාවට ස්වේච්ඡා බළසේනා පුහුණු පාසලේ සේනාවිධායක කර්නල් බීඑම්ආර්ජේ බණ්ඩාර ද එක්විය.

# සුමිතුරු දැයකින් දිනවමු දරුවන්

2019 ඔක්තෝම්බර් 01 දිනට යෙදී තිබූ ලෝක ළමා දිනය හා ඔක්තෝම්බර් 03 දිනට යෙදී තිබූ ලෝක අමද්‍යප දිනය මුල්කර ගනිමින් "සුමිතුරු දැයකින් දිනවමු දරුවන්" මැයෙන් වූ දේශනයක් වන්නි ආරක්‍ෂක සේනා මූලස්ථාන ශ්‍රවණාගාරයේදී පැවැත්විණ.

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අධ්‍යක්‍ෂක බ්‍රිගේඩියර් ආර්එම්පීජේ රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් මත එම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ රාජකාරියේ නියුතු ලුතිනන් කර්නල් බීජීඑස් සමන්ති (ජාශීබ) විසින් අදාළ දේශනය මෙහෙයවන ලදී.

ආරක්‍ෂක සේනා මූලස්ථානය වන්නි ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ මගපෙන්වීම යටතේ සිදුකෙරුණු මෙම දේශනය සඳහා ආරක්‍ෂක සේනා මූලස්ථානය වන්නි හා ඒ යටතේ පාලනය වන සේනාංක, බළසේනා සහ ඒකකයන්හි රාජකාරී කරනු ලබන නිලධාරීන් හා සෙසුනිලයින් 750 කට වැඩි පිරිසක් සහභාගී වූහ.



# ඉංග්‍රීසි දැනුම වර්ධනයට අතහිත





යාපනය ආරක්ෂක සේනා ආඥාපති ගේ සංකල්පයකට අනුව එම බලප්‍රදේශයේ ස්ථාපිත ඒකකයන්හි රාජකාරී නියුතු සෙබළ සෙබළියන්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කිරීමේ අරමුණින් සංවිධානය කළ ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාවක් ඉකුත් ජූලි 11 සිට ඔක්තෝම්බර් 02 දක්වා යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේදී පවත්වන ලදී. සෙබළ සෙබළියෝ 29 දෙනෙක් සහභාගි වූ මෙම පාඨමාලාවේ සහතිකපත් ප්‍රදානය කිරීමේ අවස්ථාවට යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය ඩබ්ලිව්ඩබ්ලිව් යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී සහභාගී විය. පාඨමාලාවේ ප්‍රථම ස්ථානය සෙ/420036 ලා/කෝ පීරිස් එම්ආර් - 12 ගැමුණු හේවා බළකායද, දෙවන ස්ථානය සෙ/2087745 ආකාසෙ මධුෂානි කේඑම්ජේ - 4 ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය ද, තෙවන ස්ථානය සෙ/68044 ලා/කෝ තෙන්නකෝන් ටීඑම්ජීඑන් - 4 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකාය ද හිමිකර ගත්හ. මෙම අවස්ථාවට 52, 55 සේනාංකාධිපතිවරු, ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගි වූහ.

# බළඇණි පුහුණුවීම් සාර්ථකව නිමකෙරේ





ඉකුත් අගෝස්තු මස 05 සිට සැප්තැම්බර් මස 28 දක්වා 23 සේනාංක පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලද 10 වන ගජබා රෙජිමේන්තුවේ බළඇණි පුහුණුවීම් සඳහා එම ඒකක සියලු නිලයෝ සාමූහිකව එක්වූහ.





# පාඨමාලාව සාර්ථකව නිමකරමින්

වෘත්තීය පුහුණු අධිකාරියට අනුබද්ධිත රණවිරු සම්පත් කේන්ද්‍රය මගින් පවත්වන ලද පාඨමාලාවන් හැදෑරූ සෙනීන් වෙත සහතිකපත් ප්‍රදානය පසුගිය ජනවාරියේදී යුද්ධ හමුදාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එම අවස්ථාව සඳහා සහභාගීවීමට අපහසු වූ සෙනීන් සඳහා සහතිකපත් ප්‍රදානය කිරීමේ උත්සවයක් රණවිරු සම්පත් කේන්ද්‍ර නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් සැප්තැම්බර් 26 පවත්වන ලදී.

## සුවඳ හදවත

මලක් උනත් හැම මලකම
පෙති සුමුදු නැති...
පෙති සුමුදු නැතත් ඒ මල්වල
සුවඳ ඇති...
අවියක් අත ඇතත් කුහුඹුවකුදු
මරා නැති...
උණ්ඩයකටත් ආදර හදවතක්
ඇති...
පත්ඉරු ඇතත් එහි කිසිවක්
ලියා නැති...
නොලියූ නමුත් කවි පද හිත
පුරා ඇති...

*ඩබ්ලිව්ඩීඑන්ඩබ්ලිව් මේජර් කුමාර
ශ්‍රීලංජාආබමු
61 සේමු - වව්නියාව*

## හෙටලොවක් තනන්නට

ආධිත්‍යයෙන් ඔද වැඩුණු
තුරුණු වියට සවිබලය
ජීවිතය යදිමින් අඬගසනා
මාරපරාජය කරනු වස්
ඉතිරිව ඇත පුත නුඹට...
වැදූ මව් හා සමකොට ඇති
රට, ජාතිය, සාමය
මතු පරපුරටත් දායාද කරන්නට
සබඳ මා අතහැර යනු
හෙටලොවක් තනන්නට...

*කපිතාන් එල්ජීසී සංජීව
17(සේවා) ශ්‍රීලංසිරෙ
යුහ කඳවුර - වව්නියාව*

## අතීතය

සොඳුරු සුයාමය
පහන් වන්නට
පුරාපෑ කීපයක්
යුද බියේ හඬ
කම්පෙති පුරා ගැටෙත්ම
සාමයේ
පෙරනිමිති පතුරමින්
සමුගෙන යනවා...
රිය සකි පසුකරන්
යාපනය නෙතින් ගෙන
විරුවන් සිතින් ගෙන
වඳිමි මව්බිම
දෑත් එක්කොට...
මිටමොලවාගෙන
වන්දනාවේ ඇවුදින් අප...

*සෙ/480245
ලා/කෝ ජයසිංහ එන්ජීඑන්
24 වන ගජබා රෙජිමේන්තුව
යුහ කඳවුර - මන්නාරම*

## මරණය

දැනෙන දෙයක්
කුලියට ගත් ජීවිතයක්
ඔහේ ගෙවනවා...
ගෙනා ආයු ඉවරවෙලා
යන්න දවස පැමිණියාම
කාටත් නොකියම මෙලොවින්
අදද, හෙටද, සතියකින්ද
නැතිනම් මාසෙන් දෙකෙන්ද
නොදැන අපිත් හිනා වෙවී
දවස් ගෙවෙනවා...
ඉතුරු කරල
මතක හිටින නමක් තියල
යාහැකිනම් අප මැරුනත්
නම පවතිනවා...

*සෙ/480250 කෝප්‍රල් ධනුෂ්ක පීපීජී
24 වන බළඇණිය ගජබා රෙජිමේන්තු
යුහ කඳවුර - මන්නාරම*

## සෙබළ සිතුවිලි

ලස්සන සඳක් අහස් ගැබ සිට
කරුවල රැය එළිය කෙරුවත්...
දිදුලන තරු දහස් ගණනින්
රැය පුරා අහස් ගැබ සැරසු මුත්...
නිදි වර්ජිත නෙත් රැය පුරා
ඇසි පියන් වැසි වැසී තිබුණත්...
අවධියෙන් මා සැම මොහොතේ
රිදුම් දිදී මා වෙහෙස කෙරුවත්...
මාගේ අරමුණ දිනුම මිස
පරාජය නොව කිසිදාකත්...
මාපිය සොයුරන් සිහිවී
නිතර නිතර දෑස තෙත් කෙරුවත්...
පතිනියයි ඇය මා ජීවිතයේ
උපදින මතු හැමදාමත්...
ආදරේ දුන් ඔබේ හදවත
නිතර නිතර මතක අවධි කෙරුවත්...
මාපිය සොහොයුරන් මෙන්
ඔබත් ශක්තියයි මට හැමදාමත්...
කෙතරම් දුක් ගැහැට ලැබුණත් මා හට
මේ කටුක කාලයේදීත්...
සතුරු ග්‍රහනෙන් වෙළුණු මගෙ රට
බේරා ගැනුමයි අරමුණ හැමදාමත්...
දිවිපුදා හෝ රට රැකුමයි
ඔබ සැම රැකුමයි මා ආශාවත්...
නිදිවරා සේවය කරන්නේ
ඒ නිසයි දින ගණන් නාමත්...
ආදරෙයි මා රටට දැයට
ජීවිත ගමනේ මතු හැමදාමත්...

*සෙ/384550 රසෙ දිල්ෂාන් යූඑම්ජී
20 ශ්‍රීලංසිරෙ, යුහ කඳවුර
පෙරියවලයන්කඩ්ඩු*




## බලාපොරොත්තුව

පුංචි කාලෙ ආදරෙ කළ හැටි මතකයි අම්මේ
මා හොඳ කෙනෙකු වෙන සිහිනය දැක්කානෙ අම්මේ
සුදු කොලර් රස්සා නොකරත් අම්මේ
රටේ දෙවියෙක් ලෙස මා හට සලකනවා අම්මේ

රජ සැප කුමටද සාමය නැතිදා අම්මේ
එදා එහෙම මට සිතුනා නිරතුරුවම අම්මේ
කොටි සොය සොයා මහ වන පීරුවා අම්මේ
යුද්ධය ජය ගන්න අප ලේ හැලුවා අම්මේ

එඩිතර ගතිය මගෙ සිතතුළ ඇත අම්මේ
අපි දැන් අවසානයට ලං වෙනවා අම්මේ
නන්දිකඩාල් කලපුව පේනවා අම්මේ
සාමය රැකගන්න අපි ඉදිරියටම ඇදෙනව අම්මේ

අවුරුද්දට ගෙදර එන්නට වෙන්නෑ අම්මේ
සාමය උදාවෙන්නට තව ටික දවසයි අම්මේ
සාමය සතුට ඇති රටකුත් සමගින් අම්මේ
මේ ටික දුරත් අවසන් කර එන්නම් අම්මේ

*සෙ/331680 සාසෙ මහානාම බීජීසීකේ
23 ශ්‍රීලපාහ, යුහ කඳවුර
පෙරියකාඩු, වව්නියාව*

## අතීතය

සිහිනෙන් අවධිව
හඬයි ඈ ඉකිබිඳව
සනසන්නට ඇයව
දරමි මා වෙහෙස නිබඳව...
දරු සෙනෙහසට
කවිපද ලියන්නට
හයිය ඈ සිතට
හඬනු අම්මා දුටු විට...
අහිමි උනාට
පුතේ නුඹ අපට
දිරිය ඇත මට
මව බලා ගන්නට...
පිදුවෙත් දිවි රට වෙනුවෙන්
පුතුනි නුඹයි හෙළ දෙවියන්
තියා වඳිමු දෑත් මුදුන්
පින් වන්තයි මගේ පුතුන්...

*ලුතිනන්(උපා) ආර්එම්පී ජයරත්න යූඑස්පී
ගරෙ
සහකාර භකාස නිලධාරී
561 බසේමු - කනකරායන්කුලම්*

## යුද්ධය

ආරම්භය
සාමය
මධ්‍ය ලක්ෂය
භූමිය
අවසානය
මැරුණු
මිනිස් ඔලුගෙඩි
ටිකක්
නවත් එපා
යුද්ධය...

*සෙ/482736 සාසෙ දිසානායක
ඩීඑම්ජීඑම්
24 වන බළඇණිය ගජබා රෙජිමේන්තුව
යුහ කඳවුර - මන්නාරම*

# රෙජිමේන්තු ඉතිහාසය





*අණදෙන නිලධාරී*
*කර්නල්*
*ඩබ්ලිව්ජීපී සිසිර කුමාර ආර්එස්පී*

# ශ්‍රී ලංකා රයිෆල් බළකාය

බ්‍රිතාන්‍ය පාලන සමයේදී මෙරට ආරක්ෂක හමුදාවක අවශ්‍යතාව සපුරාලීම වස් සීමිත හට පිරිසකගෙන් යුතුව ආරක්ෂක සේනාවක් බිහි කර ගන්නා ලදී. නමුත් මෙකළ රටේ ප්‍රධාන ආර්ථික ක්ෂේත්‍රය වූ වැවිලි කර්මාන්තයේ ආරක්ෂාව වෙනුවෙන් හට පිරිසක් වෙන් කර ගැනීමේ අවශ්‍යතාව එකළ මෙරට පදිංචිව සිටි යුරෝපීය වැවිලිකරුවන් විසින් පෙන්වා දෙන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස රාජකීය නාවික හමුදාවේ කපිතාන් ආර් එම් ෆර්ගියසන්ගේ අණ දීමෙන් ලංකා වැවිලිකරුවන්ගේ රයිෆල් බළකාය පිහිටුවන ලදී. පුද්ගලිකව භාවිතා කරන අශ්වයෙකු සහ 303 වර්ගයේ රයිෆලයක් තිබීම මෙම බළකායට බැඳීමට තිබූ සුදුසුකම වූ අතර එකළ ලංකාවේ සිටි ධනවත් වැවිලිකරුවන් මෙම බළකායට එක් විය. පසුව 1 වන ලෝක යුද්ධය සහ දකුණු අප්‍රිකාවේ "බොයර්" සංග්‍රාමයට සහභාගී වූ මෙම බළකායට එම යුද්ධයේ දක්වන ලද දක්ෂතා සඳහා බ්‍රිතාන්‍ය මහරජුගෙන් වර්ණ ධජ පවා හිමි ගන්වනු ලැබිය. 1949 දී දෙවන ලෝක යුද්ධය අවසානයේ මෙම බළකාය විසුරුවා හැරීමට ලක් රජය ක්‍රියා කළේය. ඒ අනුව විසුරුවා හරින ලද බලඇණියේ වර්ණ ධජ කොළඹ ශාන්ත පීතර දෙව් මැඳුරට පරිත්‍යාග කරන ලදී.

කාලයාගේ ඇවෑමෙන් ලක්බිම අධිරාජ්‍යවාදී පාලනයෙන් නිදහස ලබා සාමයේ අරුණලු භුක්ති විඳිමින් සිටි සමයේ කුරිරු ත්‍රස්තවාදයේ පීඩනයට නතු විය. උතුරට සහ නැගෙනහිරට සීමා වූ යුද්ධය කෙමෙන් දකුණට සංක්‍රමණය විය. මෙකළ ආර්ථිකය රැඳී තිබූ වැවිලි කර්මාන්තය ආශ්‍රිතව ආරක්ෂාව සම්බන්ධ තර්ජන ඉස්මතු විය. මෙම අවස්ථාවේ නැවත වැවිලිකරුවන්ගේ රයිෆල් බළකායට සමාන බළකායක අවශ්‍යතාව මතු වූ අතර එම අඩුව පිරිමසා ලීමට පාබල ආධාරක රෙජිමේන්තුවක් ලෙස ශ්‍රී ලංකා රයිෆල් බළකාය බිහි කරන ලදි. 1984 දෙසැම්බර් මස 10 වන දිනදී 1 වන රයිෆල් බළකාය මහනුවර පල්ලෙකැලේ සහ දෙවන රයිෆල් බළකාය හොරණ නිව්ශටිල් වත්ත ප්‍රදේශයේ ස්ථාපනය කරන ලදි.

**"රටේ ප්‍රධාන ආර්ථික ක්ෂේත්‍රය වූ වැවිලි කර්මාන්තයේ ආරක්ෂාව වෙනුවෙන් හට පිරිසක් වෙන් කර ගැනීමේ අවශ්‍යතාව එකළ මෙරට පදිංචිව සිටි යුරෝපීය වැවිලිකරුවන් විසින් පෙන්වා දෙන ලදි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රාජකීය නාවික හමුදාවේ කපිතාන් ආර් එම් ෆර්ගියසන්ගේ අණදීමෙන් ලංකා වැවිලිකරුවන්ගේ රයිෆල් බළකාය පිහිටුවන ලදි. පුද්ගලිකව භාවිත කරන අශ්වයෙකු සහ 303 වර්ගයේ රයිෆලයක් තිබීම මෙම බළකායට බැඳීමට තිබූ සුදුසුකම වූ අතර එකල ලංකාවේ සිටි ධනවත් වැවිලිකරුවන් මෙම බළකායට එක් විය."**



බලඇණි දිනය සැමරීම 1987/02/15

මෙකල සිටි කීර්තිමත් වැවිලිකරුවෙකු සහ ව්‍යවසායකයෙකු වූ ලුතිතන් කර්නල් රන්ජන් විජේරත්න 2 වන රයිෆල් බළකායේ අණදෙන නිලධාරී ලෙස පත්විය. පසු කලෙක ආරක්ෂක නියෝජ්‍ය ඇමති ලෙස එල්ටීටීඊ ත්‍රස්තවාදයට එරෙහි සටනේ නියමුවෙකු මෙන්ම දකුණේ විප්ලවකාරීන් මෙහෙයවූ ප්‍රචණ්ඩකාරී ත්‍රස්තවාදය මර්ධනය කිරීමට මුල් වූ මෙතුමා මරාගෙන මැරෙන බෝම්බයකින් ඝාතනය කිරීමට එල්ටීටීඊය සමත් විය. මරණයෙන් පසුව ජෙනරාල් නිලයට උසස් කරන ලද මෙතුමා ශ්‍රී ලංකා රයිෆල් බළකායට අභිමානයක් විය. පසුව 1 වන බළකායට පත් වූ ලුතිනන් කර්නල් පෙම්සිත් සෙනෙවිරත්න නිලධාරීතුමන්ද ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සභාපති ධුරය ඉසිලූ එවක වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු විය.

වර්ෂ 1996 දී 1 වන සහ 2 වන ශ්‍රී ලංකා රයිෆල් බළකායන් දෙක ඒකාබද්ධ කර 1 වන ශ්‍රී ලංකා රයිෆල් බළකාය වශයෙන් එක් ඒකකයක් බවට පත් විය. පසුව වසර 2006 පෙබරවාරි මස 15 වන දින නැවතත් 2 වන ශ්‍රී ලංකා රයිෆල් බළකාය නගා සිටුවන ලද අතර එහි මූලස්ථානය ගම්පොල අටබාගේ හිදී පිහිටුවන ලදී.

මධ්‍යම පලාත කේන්ද්‍ර කරගෙන වැවිලි කර්මාන්තයේ ආරක්ෂාව උදෙසා ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රයිෆල් බළකා ඒකක දෙකම බලප්‍රදේශයේ ආරක්ෂාව උදෙසා අනුපමේය මෙහෙයක් ඉටු කරන ලදී. ප්‍රදේශයේ වැදගත් ආර්ථික මර්මස්ථාන වන විදුලි බලාගාර, මහවැලි වේලි, සම්ප්‍රේෂණ මධ්‍යස්ථානවලට ආරක්ෂාව සපයමින් ත්‍රස්තවාදයේ සෙවනැලිවලින් මධ්‍යම පලාත බේරා ගැනීමට මෙම බළකායන් දෙක කැප විය. වර්තමානයේද මෙරට වැදගත්ම ප්‍රදේශ වන මාතලේ සහ මහනුවර ප්‍රදේශ වල ආරක්ෂාව තහවුරු කරමින් මෙම ශ්‍රී ලංකා රයිෆල් බළකාය කටයුතු කරයි. වසර 1998 දී කුරිරු ත්‍රස්තවාදීන්ගේ ඉලක්කයක් බවට පත් වූ ශ්‍රී දළදා මාලිගාවේ ආරක්ෂාව පසුව ශ්‍රී ලංකා රයිෆල් බළකාය වෙත පවරනු ලදුව සිය නිකැළැල් මෙහෙය නවදුරටත් සපථ කරමින් මේ දක්වා බෞද්ධයන්ගේ මුදුන් මල්කඩ බඳු වූ ශ්‍රී දළදා මාලිගාවේ ආරක්ෂාව උදෙසා කැප වී සිටිති.

මානුෂීය මෙහෙයුම් සමයේ යුද්ධ හමුදාවේ පාබල ඒකක වලට සහය වෙමින් මෙම බළකායේ සෙබලුන් අරෙසෙ යා කිරීම් මත ක්‍රියාන්විත ප්‍රදේශවලට අනුයුක්තව සේවය කරන ලදි. එමෙන්ම යුද්ධ හමුදාවේ විවිධ පාලන රාජකාරීන් ඉටු කරමින් ප්‍රශංසනීය සේවාවක් ශ්‍රී ලංකා රයිෆල් බළකා සෙබලුන් සිදු කරයි. වෘත්තීය බව සහ විනය ඉහළ මට්ටමක පවත්වා ගනිමින් ද "පරාර්ථයේ යෙදෙමි" යන ඒකක උදෘත පාඨය පෙරදැරි කර ගනිමින්ද ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසකගේ අණදීමෙන් ඔපවත් වූ ශ්‍රී ලංකා රයිෆල් බළකායේ 1 සහ 2 බලඇණි 2018 වර්ෂයේ ඒකාබද්ධ කරනු ලදුව වර්තමානයේ කර්නල් ඩබ්ලිව්ජීපී සිසිර කුමාර ආර්එස්පී ගේ අණදීම යටතේ ජාතික මෙහෙවරක නියැලී සිටී.

*ඉදිරිපත් කිරීම - ශ්‍රී ලංකා රයිෆල් බළකාය*

## යුගල පද

**සර්** - කසුන් පුතා කියන්න බලන්ඩ යුගල පදයක්...

**කසුන්** - යාන වාහන...

**සර්** - තව එකක් කියන්න බලන්ඩ...

**කසුන්** - චාරිත්‍ර වාරිත්‍ර...

**සර්** - බොහොම හොඳයි... තව එකක්

**කසුන්** - වයි ෆයි...






## වතුර නැති වුනොත්

**ගුරුතුමා** - ළමයි... මේ ලොකේ වතුර නැති වුනොත් මොකද වෙන්නේ...

**සුගත්** - ඉන්ටවල් එකෙන් පස්සේ තියෙන පීරියඩ් ටික ඔක්කොම නවත්තන්න වෙනව...

**ගුරුතුමා** - ඒ මොකද ළමයෝ ඒ...

**සුගත්** - ඇයි සර්... කෑම කාලා අත හෝදන්න වතුර නැති වුනාම ඉඳුල් අතින් පෑන අල්ලං නෝට් ලියන්නද....



## කිස් එක

කෙල්ලෙක් බස් එකේදි කොන්දොස්තරට එක පාරටම ගහගෙන ගහගෙන ගියාලු...

**කෙල්ල** - වනචරයා...තමුසෙ හිතුවද මමත් වෙන ගෑනු වගේ කියල...

**කොන්දොස්තර** - ඇයි නංගි මට ගැහුවෙ...

**කෙල්ල** - තමුසෙ මගෙන් කිස් එකක් ඉල්ලුවෙ...

**සුගත්** - කිස් එකක් නෙමෙයි යෝදියෙ ඉල්ලුවෙ... මම ඉල්ලුවෙ ටිකට් එකක්...




## දකුණෙන් යාම

**ටීචර්** - ළමයි... අද අපි ඉගෙන ගන්නෙ මාර්ග නීති ගැන... සමන් කියන්න බලන්ඩ වාහන පාරෙ යන්නෙ මොන පැත්තෙන්ද කියල...?

**සමන්** - දකුණු පැත්තෙන් ටීචර්...

**ටීචර්** - ඔය ළමයට පිස්සු... වාහන යන්නෙ පාරෙ වම් පැත්තෙන්... කවුද ඔය ළමයට කියල දුන්නෙ දකුණෙන් කියල...?

**සමන්** - අපේ තාත්ත හැමදාම යන්නෙ දකුණෙන් තමයි ටීචර්... වමෙන් යන්නෙම නෑ...

**ටීචර්** - ආ... ඔයාගෙ තාත්ත වැඩ කරන්නෙ මොකේද?

**සමන්** - ජනාධිපති ආරක්ෂක අංශෙ ටීචර්...

## නියම බෙහෙත

රෑ 10 ට පමණ තුන්ඩුවක් රැගෙන ඇවිදිමින් යන තම මිතුරිය ගීතා දැක්කාය...

**ගීතා** - කොහෙද මේ රෑ තිස්සෙ ඇවිදින්නෙ...

**නයනි** - අපේ මනුස්සය ගිඩි ගිඩි ගාලා වෙව්ලනව... මේ තුන්ඩුවෙ තියෙන බෙහෙත ඉක්මනට අරන් එන්න කිව්වා...

**ගීතා** - ඉතින් ඔයාලගෙ ගෙවල් ළඟ ෆාමසිය රෑ වෙනකම් ඇරලනෙ...

**නයනි** - ඒ උනාට බාර් වහලනෙ...



## ජොයින්ට් එකවුන්ට්

**බැංකු කළමණාකරු** - මහත්තයා... එකවුන්ට් එකක් ඕපන් කරන්නද...

**රමේෂ්** - ඔව්... මට ජොයින්ට් එකවුන්ට් එකක් ඕපන් කරන්ඩ ඕන...

**බැංකු කළමණාකරු** -කාත් එක්කද ඕපන් කරන්න හදන්නෙ...

**රමේෂ්** - හොඳ සල්ලිකාරයෙක් එක්ක තමයි ඕපන් කරන්ඩ ඕන... ඉන්නවද එහෙම කෙනෙක්...

# වැඩිහිටි දිනයට අරුතක් දෙමින්







ලෝක වැඩිහිටි දිනයට සමගාමීව යාපනය අර්ධද්වීපයේ පදිංචි අඩු ආදායම්ලාභී දිළිඳු පවුල්වලින් තෝරාගත් පිරිස් සඳහා වියළි සලාක මලු බෙදාදීම ඉකුත් ඔක්තෝම්බර් 01 දින ආරක්‍ෂක සේනා මූලස්ථානය යාපනය යටතේ ඇති සියලුම බලසේනා ප්‍රදේශවල සිදුකරන ලදී. යාපනය ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ගේ උපදෙස් පරිදි මෙම මාහැගි කටයුත්ත ක්‍රියාත්මක කෙරිණ.

# VISION ENGLISH LESSON SPECTRUM

## දැක්ම ඉංග්‍රීසි පාඩම් මාලාව

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

### *Allow*

යම් කිසි ක්‍රියාවක් සිදුකිරීමට යමෙකුට **"ඉඩ දෙන්න"** යන අර්ථය ඇතිව භාවිතා කරන උපකාරක ක්‍රියා පදයක් ලෙස වාක්‍ය කණ්ඩ නිර්මාණය කිරීමේදී භාවිතා වේ.

Formula - සූත්‍රය

> **Allow + Objective pronoun + To + Verb (infinitive) + Object + Rest.**
> අලව් + ඔබ්ජෙක්ටිව් ප්‍රෝනවුන් + ටූ + වර්බ්(ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
> ඉඩ දෙන්න + කර්ම කාරක සර්වනාම පද + ක්‍රියා පදයේ මූල ස්වරූපය + කර්මය + ඉතිරිය.

Ex/උදා :-

1. Allow me to go out.
   අලව් මී ටූ ගෝ අවුට්.
   මට එළියට යන්න ඉඩ දෙන්න.

2. Allow them to speak.
   අලව් දෙම් ටු ස්පීක්.
   ඔවුන්ට කථා කරන්න ඉඩ දෙන්න.

3. Allow him to sing songs.
   අලව් හිම් ටු සිංග් සොන්ග්ස්.
   ඔහුට සිංදු කියන්න ඉඩ දෙන්න.

4. Allow her to go home.
   අලව් හර් ටු ගෝ හෝම්.
   ඇයට ගෙදර යන්න ඉඩ දෙන්න.

5. Allow it to eat rice
   අලව් ඉට් ටු ඊට් රයිස්
   ඌට බත් කන්න ඉඩ දෙන්න.

Nota Bene/සැ:යු :-

- • Allow :- **"ඉඩ දෙන්න"** ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම කණ්ඩය කිසිදු වෙනසකින් තොරව වාක්‍යයේ භාවිතා වේ.
- • Objective Pronoun :- කර්ම කාරක සර්වනාම පද වශයෙන් පහත පෙන්වාදී ඇති පද භාවිතා වේ. me – මට, us – අපට, them – ඔවුන්ට, her – ඇයට, him – ඔහුට, it - ඌට
- Verb :- ක්‍රියා පදය (Infinitive) ක්‍රියා මූල පදයක් ලෙස පමණක් භාවිතා වේ.
- Object :- කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම් ලබන පුද්ගලයෙකු හෝ පදයක් වේ නම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන, බහුවචන බේදයකින් තොරව භාවිතා වේ.
- Rest :- ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

> **Analysis of the sentence formation - වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේශනය.**
> Allow + To + Objective pronoun + Verb (Infinitive) + Object + Rest.
> අලව් + ටූ + ඔබ්පෙක්ටිව් ප්‍රෝනවුන් + වර්බ(ඉන්ෆිනිටිව) + ඔබ්පෙකට් + රෙස්ට්.
> ඉඩ දෙන්න + විෂය මුල සර්වනාම පද + ක්‍රියාපදයේ මූලික ස්වරූපය + කර්මය + ඉතිරිය.
>
> Allow me to go out.
> අලව් මී ටු ගෝ අවුට්
> මට එළියට යන්න ඉඩදෙන්න.

***English vision*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද ඔබට මඟ හැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.



**කපිතාන් චමින්ද ලියනගේ - ශ්‍රීලයුපොදුසේබ**
**සංඥා පුහුණු පාසල - බුවැලිකඩ**
**www.englishvision.lk**



ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපති ලෙස
**මේජර් ජෙනරාල් එච්ආර්එන් ප්‍රනාන්දු ආර්එස්පී එන්ඩීසී**
2019 ඔක්තෝම්බර් මස 16 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ගැමුණු හේවා බළඇණියේ රෙජිමේන්තු අධිපති ලෙස
**මේජර් ජෙනරාල් ටීඑස් බන්සජායා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ**
2019 ඔක්තෝම්බර් මස 26 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



611 බලසේනාවේ බලසේනාධිපති ලෙස
**බ්‍රිගේඩියර් ඩබ්ලිව්බීඩබ්ලිව්එම්ආර්එස්පී අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
2019 සැප්තැම්බර් මස 23 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



59 සේනාංකයේ කර්නල් (පාලන/හකාස) ලෙස
**කර්නල් ඒසීඒ ද සොයිසා යූඑස්පී එල්එස්සී**
2019 ඔක්තෝම්බර් මස 02 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ජ්‍යෙෂ්ඨ කර්නල් සම්බන්ධීකරණ නිලධාරී ලෙස
**කර්නල් එන්ඩීපී ජයතිලක**
2019 ඔක්තෝම්බර් මස 14 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



55 සේනාංකයේ කර්නල් ප්‍රමාණි ලෙස
**ලුතිනන් කර්නල් ඒඑම්ජී අබේසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
2019 ඔක්තෝම්බර් මස 08 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ප්‍රධාන මාණ්ඩලික නිලධාරී 1 (සම්බන්ධීකරණ) ලෙස
**ලුතිනන් කර්නල් එස්පී මලවරගේ ආර්එස්පී යූඑස්පී අයිජී**
2019 ඔක්තෝම්බර් මස 16 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) මාණි 1(හකාස) ලෙස
**ලුතිනන් කර්නල් කේපීඑන්එස්කේ කාරියවසම් ඒඒටීඕ එල්එස්සී**
2019 ඔක්තෝම්බර් මස 08 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ප්‍රධාන මාණ්ඩලික නිලධාරී 1 (හකාස) ලෙස
**ලුතිනන් කර්නල් කේඑම්ජේඑන්ආර්කේ චන්ද්‍රසේකර**
2019 ඔක්තෝම්බර් මස 07 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු




යුද්ධ හමුදා මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ ආරක්ෂක සම්බන්ධීකරණ නිලධාරී ලෙස
**ලුතිනන් කර්නල් යූඑන්ජී කරුණාරත්න ආර්එස්පී පීඑස්සී**
2019 ඔක්තෝම්බර් මස 23 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



12 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙස
**මේජර් එච්ටී ද සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී**
2019 ඔක්තෝම්බර් මස 07 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



20 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙස
**මේජර් සීඑස් සේරසිංහ**
2019 සැප්තැම්බර් මස 12 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු




**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය



**අධීක්ෂණය**

බ්‍රිගේඩියර් ආර්එම්පීජේ රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල් එස්ජේ කාරියකරවන
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විපාරෙ



**ප්‍රධාන සංස්කාරක**

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ ශ්‍රීලයුපොදුසේබ



**සහාය සංස්කාරක**

කපිතාන ආර්ඩී හේවාවිතාරණ ශ්‍රීලයුකාබ



**සෝදුපත් කියවීම**

කපිතාන් ඩීඑම් දිල්හාරා සජීවනී ජාශිබ

**පරිගණක අකුරු සංයෝජනය,
කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 සැරයන් සේනාරත්න පීසී 3 ඉසේරෙ
සෙ/753797 ලාන්ස් කෝප්‍රල් කුමාරසිංහ එම්පීඑන්එම් 11 ඉසේරෙ
සෙ/2081045 ඉසෙ ලක්තිලිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය
ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන - 011 2993076
යුහ දිගුව - 51445/51446

# රණබිමේ මතක



## නිහඬ සවන, විපරම් දෙනෙත
## නිසැක ජයක පෙර නිමිති වේ...

ආවට ගියාට යුද්ධ කරන්න බැහැ. ඒකට සැලසුම් විමර්ශන වගේම පෙරහුරුත් අවශ්‍යයයි. සංග්‍රාම භූමියට පය තියන්න කලින් තමන් කළ යුතු දේ මොකක්ද කියල හරියටම දැනගන්න ඕනෙ. ඒ වගේම අනෙකාගේ කාර්යභාරය ගැනත් අවබෝධයෙන් සිටීම වැදගත්. ගෙවුණු දශක තුන පුරා ත්‍රස්තවාදීන්ට එරෙහිව කරපු හැම මෙහෙයුමකදීම මේ න්‍යායන් හරියට ක්‍රියාත්මක වුණා. අවසන් ජයග්‍රහණයේ රහසත් ඒකමයි. හැබැයි අමතක කරන්න එපා. රණවිරුවන්ගෙ අප්‍රතිහත ධෛර්යය අධිෂ්ඨානය හා කැපවීම තුළින් මිස මේ කිසිවක් ඉබේ සිද්ධ වුණේ නැහැ.

